# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report 2018



ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministry of Mass Media

# 2018

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report


**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**வெகுசன ஊடக அமைச்சு**

**Ministry of Mass Media**

# පටුන


| | ආයතනය | පිටු අංක |
|---|---|---|
| 01. | ජනමාධ්‍ය අමාත්‍යාංශය | 1 |
| 02. | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 21 |
| 03. | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 24 |
| 04. | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 32 |
| 05. | සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | 35 |
| 06. | සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 40 |
| 07. | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 45 |
| 08. | සැලසිනෙ රූපවාහිනී ආයතනය | 51 |

# ජනමාධ්‍ය අමාත්‍යාංශය

## හැඳින්වීම

ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කර මාධ්‍ය නිදහස පවත්වා ගෙන යාමට අවැසි පරිසරය ක්‍රියාත්මක නොවන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ජනතාව තැබූ විශ්වාසය බිඳ වැටීම නොවැළැක්විය හැකිය. මේ හේතුවෙන් මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන ආරක්ෂා වන පරිදි නියාමනය කරමින් යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදාකරලීමේ අරමුණ පෙරදැරිව 2018 වසරේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ආයතන 09 ක් ක්‍රියාත්මක විය. 2017 ජූනි මස 09 දිනැති අංක 2022/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ජනමාධ්‍ය අංශය මුදල් අමාත්‍යංශය වෙත අනුබද්ධ කරන ලදී.

## දැක්ම

"හොඳින් දැනුම්වත් වූ බහුමතික සහ සක්‍රීය  සමාජයක්"

## මෙහෙවර

"ජනහිතකාමීවූත්, සංවර්ධන නම්‍යවූත්, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම"

## අරමුණු

- යහපත් ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම.
- මහජනතාවට තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අවස්ථාවන් පුළුල් කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රය නවීන තාක්ෂණය සමග යාවත්කාලීන කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- මාධ්‍ය වෘත්තීකයන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය අනුබලය සැපයීම.
- ජාතික සංවර්ධන ප්‍රයත්නය සඳහා මාධ්‍ය දායකත්වය හා සහභාගීත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වශයෙන් රටේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබාදීම.
- අමාත්‍යාංශ අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය.
- අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල සම්පත් ඵලදායී ලෙස උපයෝජනය.
- අදාළ පාර්ශව සම්බන්ධීකරණය තුළින් සමස්ථ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

## කාර්යයන් හා කර්තව්‍යයන්

- ජනමාධ්‍ය විෂයයන්ට සහ අනුගත දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම, ඇගයීම, අධීක්ෂණය හා අනෙකුත් සියළු විෂයයන්ට අදාළ කටයුතු
- ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම.
- ජනතාව තුළ දැනුම, ආකල්ප සහ රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම.
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම.
- ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රකාශන හැර රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීමේ කටයුතු
- ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම.
- වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු

## 2018.01.01 සිට 2018.12.31 දක්වා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

### 01. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ හා 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම දරනු ලබන්නේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයයි. 2017 පෙබරවාරි මස 03 වන දින මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අතර රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලන මූලධර්මයන් හොඳින් ක්‍රියාවට නැංවීමත් එමඟින් දූෂණයෙන් තොර වඩාත් යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2018 වසර තුළ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකය විසින් සිදු කරන ලද කාර්යභාරය පහත දක්වා ඇත.

1.1 ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනීමේ විශේෂ ඒකකය ශක්තිමත් කිරීම.

- මේ වන විට අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනීමේ විශේෂ ඒකකය ස්ථාපනය කර තනතුරු අනුමත කිරීම සහ අවශ්‍ය කාර්යාලීය උපකරණ ලබාදීම සිදු කර ඇත.

1.2 තොරතුරු දැනගැනීමේ සම්පත් මධ්‍යස්ථානය (RTI Resource Center) ගොඩනැගීම.

- මෙම සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීමට අදාළ සංකල්ප පත්‍රිකාව පිළියෙල කිරීම ආරම්භ කර ඇත. ඒ සඳහා උපදේශකත්වය ලබාදීම සඳහා මූල්‍යමය දායකත්වය USAID ආයතනය ලබාදේ.
- ඒ අනුව 2019 වසර තුල මෙම සම්පත් මධ්‍යස්ථානය ගොඩනැගීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

1.3 ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් රජයේ පොදු අධිකාරීන් දැනුවත් කිරීම.

- මෙයට අදාලව මූලික (PILOT) ව්‍යාපෘතිය කෝට්ටේ මහ නගර සභාව, ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහභාගීත්වයෙන් ආරම්භ කර ඇති අතර ඒ මඟින් එක් එක් ආයතනයන් වෙත ප්‍රමාණවත් පුහුණුවක් සහ වෙබ් අඩවි යාවත්කාලීන කිරීම සඳහා

අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය ආධාර ලබාදීම සිදු කෙරේ. මේ සඳහා මූල්‍යමය දායකත්වය UNDP ආයතනය ලබා දේ.

- එයට අමතරව ජනමාධ්‍ය අමාත්‍යංශයේ සියලු තොරතුරු මහජනතාවට ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් ඩිජිටල් තිරයක් අමාත්‍යංශ පරිශ්‍රයේ සවි කර ඇත.

1.4 තොරතුරු පනත සම්බන්ධයෙන් පුහුණුකරුවන් නිර්මාණය කිරීම.

- 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණුකරුවන් නිර්මාණය කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩමුළු 04 ක් පවත්වන ලද අතර ඔවුන් මේ වන විට මේ පනත සම්බන්ධයෙන් පැවැත්වෙන පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබා දේ.
- සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා, අමාත්‍යංශ හා ශ්‍රී ලංකා පොලිසීය ආවරණය වන පරිදි මෙම නිලධාරීන් පුහුණු කරන ලද අතර මෙම වසරේදී එම නිලධාරීන් සඳහා බුද්ධි කලම්භන වැඩසටහනක් පවත්වන ලදී.

1.5 තොරතුරු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- 2016 හා 2017 යන වර්ෂයන්හිදී සියලු රජයේ නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වූ බැවින් මෙම වර්ෂයේදී ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා නොදුනි.
- කෙසේ වුවද ආයතන මඟින් පුහුණු වැඩසටහන් සඳහා සිදු කරන ඉල්ලීම් ප්‍රකාරව වැඩමුළු සංවිධානය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී සම්පත්දායකත්වය සහ සම්පත් ලබාදීම සිදුකරනු ලැබේ.

1.6 තොරතුරු දැනගැනීමේ අත්පොත, පුහුණු මොඩියුලය සහ පුහුණු කිරීමේ ක්‍රමවේද යන පොත් නැවත මුද්‍රණය කිරීම.

- තොරතුරු දැන ගැනීමේ පනතින් පිටපත් 6000 ක් හා අත් පොත් පිටපත් 1000 නැවත මුද්‍රණය කරන ලද අතර තොරතුරු දැනගැනීමේ අත්පොතෙහි දමිළ පරිවර්තනය ද ප්‍රකාශයට පත්කරන ලදී.

1.7 ග්‍රාම නිලධාරීන්, කේෂ්ත්‍ර නිලධාරීන් සහ ප්‍රජා මූල නායකයින් සඳහා මෙම පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පැවැත්වීම.

- මෙම වැඩමුළු ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලද අතර මේ වන විට අනෙකුත් දිස්ත්‍රික්කයන්හිද ආරම්භ කර ඇත.

1.8 තොරතුරු නිලධාරීන් සඳහා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම.

- දකුණ, උතුර, බස්නාහිර හා මධ්‍යම පළාත්හි තොරතුරු නිලධාරීන් සඳහා අත්දැකීම් හුවමාරු වැඩසටහන් 2017 වර්ෂයේදී පවත්වන ලද අතර සබරගමුව, නැගෙනහිර සහ උතුරු මැද පළාත සඳහා වැඩසටහන් 2018 වසර තුල පවත්වන ලදී.

1.9 පාසල් විෂය ධාරාව සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය විෂයක් ලෙස ඇතුලත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා එක්ව සාකච්ඡා පවත්වන ලද අතර 2020 වර්ෂයේ සිදු කරන නිර්දේශ සංශෝධනයේදී තොරතුරු පනත විෂයක් ලෙස ඇතුළත් කිරීමට එකඟ විය.

- ඒ අනුව 9, 10, 11 සහ උසස් පෙළ ශ්‍රේණීන්හි විෂයන් ආවරණය වන පරිදි පුරවැසි අධ්‍යාපනය, ජනමාධ්‍ය අධ්‍යයනය සහ දේශපාලන විෂය තොරතුරු පනතට ඇතුළත් කිරීම.
- එයට අදාලව පුහුණු නිලධාරීන් පුහුණු කිරීම ආරම්භ කරන ලද අතර මේ වන විට දේශපාලන විෂය ධාරාවන් යටතේ පුහුණු කිරීම් අවසන් කර ඇත.

1.10 විශ්ව විද්‍යාල අධ්‍යාපන හා තාක්ෂණික අධ්‍යාපන විෂය ධාරාව සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළත් කිරීම.

- මේ සම්බන්ධයෙන් මූලික සාකච්ඡා වට කීපයක් පැවැත්වූ අතර අවශ්‍ය ඉදිරි කටයුතු තවදුරටත් සාකච්ඡා කරමින් පවතී.
- සියලු විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ නිලධාරීන් සඳහා පනත සම්බන්ධයෙන් වැඩමුළුවක් මීට සමගාමීව පවත්වන ලදී.

1.11 තොරතුරු අයිතිය සඳහා මාර්ගගත අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාවක් රජයේ නිලධාරීන් සඳහා හඳුන්වාදීම.

- UNDP හා SLIDA ආයතන හා ඒකාබද්ධව හඳුන්වා දුන් මෙම වැඩසටහන හරහා රාජ්‍ය සේවයට ඇතුල්වන ආධුනික නිලධාරීන් සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ අවස්ථාව හිමි වේ.

1.12 තොරතුරු පනත සම්බන්ධයෙන් වාර්තා වැඩසටහන් හා කෙටි චිත්‍රපට නිර්මාණය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය, අන්තර් ජාතික මාධ්‍ය උපයෝගීතා ආයතනය විසින් මෙම වසර තුළ නිර්මාණ 10 ක් සිදු කරන ලදී.

1.13 පුවත්පත් සඟරාව එළි දැක්වීම.

- 2018 අප්‍රේල් මස සිට "පවත" නමින් තිල පුවත්පතක් හඳුන්වා දුන් අතර එය මාසිකව දිනමිණ හා තිනකරන් පුවත්පත් සමඟ ප්‍රකාශයට පත් වේ.
- මෙයට අමතරව කුඩා අත්පොත් අත්පත්‍රිකා ද්වී භාෂා මාධ්‍යයෙන් නිර්මාණය කර පුරවැසියන් අතර බෙදා හැරීම සිදු කරමින් පවතී. ඒ සඳහා අත්පත්‍රිකා 323,000 ක් සහ අත්පොත් 250,000 ක් මුද්‍රණය කරන ලදී.

1.14 තොරතුරු දැනගැනීමේ ජාත්‍යන්තර දිනය සැමරීම.

- තොරතුරු දැනගැනීමේ ජාත්‍යන්තර දිනය සැමරීමට සමගාමී ලෙස 2018 සැප්තැම්බර් 20 සිට සැප්තැම්බර් 28 දක්වා තොරතුරු සතියක් ප්‍රකාශයට පත් කිරීම.
- එම සතිය තුළ තොරතුරු නිලධාරීන් සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

- ඒ සඳහා දේශීය සම්පත්දායකයින් සම්බන්ධ කර ගැනීම.
- 2018 සැප්තැම්බර් 28 දින ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ දිනය සැමරීමට සමගාමී ලෙස ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් නෙලුම් පොකුණ රඟහලේදී පැවැත්වීම.



ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
සම්මන්ත්‍රණය ඇමතීම



ගරු කථානායකතුමා
සම්මන්ත්‍රණය ඇමතීම



සම්මන්ත්‍රණය සඳහා පැමිණි ආරාධිතයින්



විද්වත් කථිකාවත

1.15 "RTI School Champion" දීප ව්‍යාප්ත පාසල් විවාද සහ රචනා තරගයක් පැවැත්වීම.

- තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමේ උපායමාර්ගයක් ලෙස පාසල් සිසුන් තුළ මෙම පනත භාවිතය ඇති කිරීමේ අරමුණින් දීප ව්‍යාප්ත පාසල් විවාද සහ රචනා තරගාවලියක් ආරම්භ කරන ලදී.
- අධ්‍යාපන අමාත්‍යංශය සහ ඒකාබද්ධව පවත්වන ලද මෙම තරග මාලාව ඉදිරියේදී වාර්ෂිකව පැවැත්වීමට බලාපොරොත්තු වේ.



නාලන්දා විද්‍යාලය, කොළඹ



හින්දු විද්‍යාලය, යාපනය

ජයග්‍රාහී පාසල් විවාද කණ්ඩායම්

1.16 තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

තොරතුරු දැනගැනීමේ පනත, ඵලදායී රාජ්‍ය සේවය, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍ය ආශ්‍රිත තේමා යටතේ විශ්ව විද්‍යාල සිසුන් හා වෙනත් වෘත්තීයවේදීන් විසින් සිදු කරන ලද පර්යේෂණයන්හි උද්ධෘත කැඳවීම හා ඒවා ප්‍රකාශයට පත් කිරීමේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් මෙම වසරේ සැප්තැම්බර් 27 දින තොරතුරු සතියට සමගාමී ලෙස කොළඹ ජානකී හෝටලයේදී පවත්වන ලදී.

1.17 එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහනෙහි හා රාජකීය විද්‍යාලයේ පවත්වන ලද ප්‍රදර්ශනයේ පුරවැසියන් දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන කුටි පැවැත්වීම.

1.18 RTI වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ නිල ෆේස්බුක් පිටුවක් හඳුන්වා දීම. RTI ගැටලු ඉදිරිපත් කිරීම සඳහා විද්‍යුත් තැපැල් ලිපිනයක් හඳුන්වා දීම.

- තොරතුරු සතියට සමගාමී ලෙස තොරතුරු පනත අලලා නිර්මාණය කරන ලද වීදි නාට්‍ය මාලාවක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි රඟ දැක්වීම.
- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන සිවිල් සංවිධාන සමඟ මාසික සාකච්ඡා මාලාවක් පැවැත්වීම සහ ඒ මඟින් ඔවුන්ගේ වැඩසටහන් සඳහා අවශ්‍ය පරිදි මුද්‍රිත පනත්, අත්පත්‍රිකා සහ පෝස්ටර් ලබාදීම.

1.19 "වටේ ගියා ඇති" කෙටි චිත්‍රපට ප්‍රදර්ශනය

තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පනත භාවිතා කර තම ගැටලු, පොදු ගැටලු විසඳාගත් පුද්ගලයන්ගේ සත්‍ය කතා ඇතුළත් කර නිර්මාණය කරන ලද කෙටි චිත්‍රපට 10 ක් 2018 සැප්තැම්බර් 21 දින සවස තරංගනී සිනමා ශාලාවේදී එළි දක්වන ලදී. ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂකවරුන් 10 දෙනෙකුගේ උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ මෙම කෙටි චිත්‍රපට සියල්ල මේ වන විට youtube ඔස්සේ නැරඹිය හැක. මාධ්‍ය ප්‍රතිසංස්කරණය සඳහා ජාතික ලේකම් කාර්යාලය, අන්තර්ජාතික මාධ්‍ය සහයෝගීතා වැඩසටහන හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව මෙය පවත්වන ලදී.

1.20 "ගමට තොරතුරු අයිතිය" - RTI ජංගම සේවය

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව මනා අවබෝධයක් පුරවැසියන් වෙත ලබාදීමේ අරමුණින් "ගමට තොරතුරු අයිතිය" නමින් ජංගම සේවයක් 2018 වර්ෂයේදී ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී. මෙහි සමාරම්භක වැඩසටහන උතුරු පළාතෙන් ආරම්භ කරන ලද අතර සෑම වසරකම සැප්තැම්බර් 28 දිනට යෙදෙන තොරතුරු දැනගැනීමේ ජාත්‍යන්තර දිනයට සමගාමී ලෙස 2018 සැප්තැම්බර් 24 දින යාපනය වීරසිංහම් ශාලාවේදී මෙය පවත්වන ලදී. උතුරේ සියලු ප්‍රදේශ ආවරණය වන අයුරින් 1000 කට ආසන්න ජනතාවක් මෙම වැඩමුළුවට සහභාගී වූ අතර මෙම ජංගම සේවය හරහා උතුරේ වැසියන් විසින් තොරතුරු දැනගැනීමට අයිතිය හා එහි වැදගත්කම පිළිබඳවත් ඒ පිළිබඳ තිබූ ගැටලු සහගත තත්වයන් පිළිබඳවත් එම අවස්ථාවේදීම විද්වත් මඩුල්ලක් මඟින් විසඳුම් ලබාදීම සිදුවිය.

**මූල්‍ය ප්‍රගතිය**

2018 වාර්ෂික අයවැයෙන් රු.මි. 30 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රු.මි. 20 ක් වැය කර ඇත.

## 02. අමරදේව සංගීත අසපුව ඉදිකිරීම

ආචාර්ය පණ්ඩිත් අමරදේව ශූරීන් විසින් සංගීත ක්ෂේත්‍රයට සිදු කරන ලද අනභිභවනීය මෙහෙය කෘතවේදීව අගයනු වස් "අමරදේව අසපුව" නමින් පර්යේෂණ, ලේඛනාගාර, පුස්තකාල හා කෞතුකාගාර පහසුකම්වලින් සමන්විත සංගීත ආශ්‍රමයක් බත්තරමුල්ල "අපේ ගම" පරිශ්‍රයේ පිහිටුවීමට කටයුතු ආරම්භ කරන ලදී.

**අරමුණු**

- සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම තුළින් ප්‍රවීණ හා ආධුනික සංගීතවේදීන්ට දේශීය සංගීත ආර ඔස්සේ තම නිර්මාණ කිරීමට පසුබිමක් සකස් කර දීම.
- අමරදේවයන්ගේ නිර්මාණ මතු පරපුර වෙනුවෙන් සජීවීව සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- සුභාවිත ගීතය (Art Songs) ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ගී පද රචනය, ගායනය, තනු නිර්මාණය හා සංගීත සංයෝජනය පිළිබඳ දැනුවත් කිරීම.
- විශ්ව සම්භාවිත හා සුභාවිත සංගීතය ගවේෂණය කිරීමට හා පර්යේෂණ කිරීමට අවස්ථාව ලබා දීම.
- විශ්ව සුභාවිත සහ දේශීය සංගීතය තුළින් පොදු ජනතාවගේ රසාස්වාදය ඔප් නංවා ගැනීමේ අවස්ථාව සලසා දීම.
- ජාත්‍යන්තර සම්මානලාභී විද්වත් දේශීය කලාකරුවෙකු පිළිබඳ අභිමානය දරුවන් තුළ හා ජනතාව තුළ ඇති කිරීම.

අසපුව ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් බත්තරමුල්ල "අපේ ගම" පරිශ්‍රයේ වෙන් කරන ලද පර්චස් 100 ක භූමි ප්‍රමාණයක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදී. මෙම පරිශ්‍රය තුළ කෞතුකාගාරයක්, ලේඛනාගාරයක්, පුස්තකාලයක්, 150 දෙනෙකුට පමණ ප්‍රමාණවත් ශ්‍රවනාගාරයක්, පටිගත කිරීම සඳහා චිත්‍රාගාරයක් හා පණ්ඩිත් අමරදේව ශූරීන්ගේ උඩුකය පිළිරුවක්ද ඉදිකිරීමට යෝජිතව ඇත. මෙහි ගෘහ නිර්මාණ කටයුතු පණ්ඩිත් අමරදේව ශූරීන් වෙත කරනු ලබන ගෞරවනීය උපහාරයක් ලෙස කිසිදු අය කිරීමකින් තොරව ගෘහ නිර්මාණ ශිල්පියෙක් විසින් සිදු කර ඇත.

2017.08.28 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය සිදු කරන ලදී.

අමරදේව සෞන්දර්ය සහ පර්යේෂණ කේන්ද්‍රය (අමරදේව අසපුව) නීත්‍යානුකූල ආයතනයක් ලෙස පාර්ලිමේන්තු පනතක් මගින් සම්මත කරගෙන ඇත.

අසපුවෙහි ඉදිකිරීමට යෝජිත කෞතුකාගාරය, ලේඛනාගාරය, හා පුස්තකාලය සකස් කළ යුතු ආකාරය පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතන සමඟ සාකච්ඡා කර ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ වාර්තා ලබාගෙන ඇත.

අමරදේව අසපුවෙහි ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ඉදිකිරීම් සමාගමක් තෝරා ගන්නා ලද අතර මධ්‍යම ඉංජිනේරු ඉදිකිරීම් ආයතනය උපදේශන ආයතනය ලෙස කටයුතු කරයි. මෙහි ඉදිකිරීම් කටයුතු 2019 වසරේ ජුනි මසදී අවසන් කිරීමට අපේක්ෂිතය.

**මූල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුව රු.මි. 190 ක් වන අතර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පමණක් ඇස්තමේන්තුව රු.මි. 148 කි. 2018 වසරේදී රු.මි. 44.53 ක් වැය කර ඇති අතර සමස්ථ මූල්‍ය ප්‍රගතිය රු.මි. 48.72 කි.

**03. ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල - 2018**

ජනමාධ්‍ය ප්‍රතිපත්තීන්හි අපේක්ෂාව වනුයේ සමාජ වගකීමක් දරමින් හා ජනතාවට නිවැරදි තොරතුරු දැනගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කරමින්, රටේ සමස්ථ ආර්ථික, සමාජ, සංස්කෘතික හා සංවර්ධන අභිලාෂ සාක්ෂාත් කරගැනීම සඳහා දායකත්වය ලබාදීමය. මේ සඳහා ජනමාධ්‍යයන්හි උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වන අතර ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය සහ වෙබ් අඩවිවල අන්තර්ගතය වගකීම් සහගතව, ස්වාධීනව හා ග්‍රාහක අපේක්ෂාවන්ට සංවේදී වන අයුරින් පවත්වාගෙන යාම උදෙසා මාධ්‍යවේදීන් දිරිගැන්වීම සිදු කළ යුතු වේ. ඒ අනුව,

- මාධ්‍යවේදීන්ගේ විවිධ දක්ෂතා, කුසලතා, හැකියාවන් හා සුවිශේෂී නිපුණතා හඳුනාගනිමින් ඒවා ඇගයීමට ලක්කිරීමට,
- වෘත්තීය මට්ටමේ මාධ්‍යවේදීන් බිහිකිරීම සඳහා පසුබිම නිර්මාණය කිරීමට නිසි මඟ පෙන්වීම් ලබා දීම හා අභිප්‍රේරණය කිරීමට,
- යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා සමස්ථ මාධ්‍ය ක්ෂේත්‍රය සවිබල ගැන්වීමට,
- ජනමාධ්‍යවේදීන් විසින් සමස්ථ සමාජය වෙනුවෙන් හිතකරවූද, නිදහස්වූද, සංවර්ධනාත්මක දෘෂ්ටි කෝණයකින් යුතු වූද මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා මාධ්‍යවේදීන් පෙළඹවීමට,
- සමස්ථ ජනමාධ්‍ය ක්ෂේත්‍රය, දැනුවත් වූ සිවිල් සමාජයක් ගොඩනැගීම සඳහා දිරි ගැන්වීමට හා සමස්ථ ජනමාධ්‍ය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි කරනු ලබන කාර්ය සාධන ඇගයීම තුළින් පූර්ණ රාජ්‍ය අනුග්‍රහය මාධ්‍යවේදීන්ට ලබා දීම සඳහා වූ

විශිෂ්ඨ මාධ්‍ය සංස්කෘතියක් රට තුළ ස්ථාපිත කිරීමට ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන් විසින් ඉටු කරනු ලබන මෙහෙවර සහ ඔවුන්ගේ දායකත්වය ඇගයීම උදෙසා ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පැවැත්වීම කාලීන අවශ්‍යතාවක් ලෙස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත.

අද්‍යතන අවධිය තුළ මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රාමාණික වර්ධනයක් ඇති වුවද ශ්‍රී ලංකාවේ ඊට සරිලන පරිදි මාධ්‍ය භාවිතය සමාජ වගකීමකින් යුතුව ගුණාත්මකව වර්ධනය වී නොමැති බව හඳුනාගෙන ඇත. එබැවින් උසස් මාධ්‍ය ප්‍රමිතීන් ගොඩනැගීමට අදාළ වන නිර්ණායක හඳුන්වාදීම සඳහා වූ පුරෝගාමී ප්‍රයත්නයක් ලෙස ද මාධ්‍යවේදීන් දිරිමත් කිරීම උදෙසා ද ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල 2018 වසරේ සිට වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කෙරේ. මෙම සම්මාන තරඟාවලිය සහ සම්මාන උළෙල සඳහා ජාතික අයවැයෙන් වාර්ෂිකව ප්‍රතිපාදන ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, සම්මාන ලබාදීමට යෝජිත ක්ෂේත්‍ර හා සම්මාන සංඛ්‍යාව හඳුනාගෙන ක්‍රියාකාරී කමිටු උපදෙස් අනුව සම්මාන තේරීම සඳහා ගුවන් විදුලි, රූපවාහිනී, පුවත්පත් හා වෙබ් යන ක්ෂේත්‍රයන් සඳහා එම ක්ෂේත්‍රයන්හි ප්‍රවීණ විද්වතුන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩල පත්කොට නිර්ණායකයන් සකස් කරන ලදී.

ජනාධිපති මාධ්‍ය සම්මාන මෙහෙයුම් කමිටුවේ සහ රේඩියෝ, ටෙලිවිෂන්, පුවත්පත් හා වෙබ් මාධ්‍ය අංශවල ප්‍රවීණයන්ගෙන් සමන්විත ජූරි කමිටුවල උපදෙස් මත සම්මාන ප්‍රදානය කල යුතු ක්ෂේත්‍ර හා සම්මාන සංඛ්‍යාව පිළිබඳ අවසන් නිගමනයට එළඹෙන ලදී.

2018.07.13 දින පල කරන ලද පුවත්පත් දැන්වීම් සඳහා අයදුම්පත්‍ර 1674 ක් ලැබිණි. පත්කරන ලද මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන්ගේ උපදෙස් හා යෝජනා මත, නම් කරන ලද විනිශ්චය මණ්ඩලයක් විසින් විනිශ්චය කටයුතු සිදුකරන ලද අතර මේ වන විට ජයග්‍රාහකයින්, නාමයෝජිතයන් හා යාවජීව යන සම්මාන සඳහා ක්ෂේත්‍ර 4 ම නියෝජනය වන පරිදි නාමයෝජනාද විනිශ්චය මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇත.

ඉසව් කළමනාකරු තෝරා ගැනීම සහ සම්මාන නිර්මාණය කිරීම සඳහා නිර්මාණකරුවකු තෝරා ගැනීමට ප්‍රසම්පාදනය සඳහා යොමු කර ඇත. මෙම උළෙලේදී එළිදැක්වීමට නියමිත සම්මාන උළෙලට සමගාමීව **"මාධ්‍ය සංකථන"** නමින් සඟරාවක් මුද්‍රණය කිරීමටත් එය විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ගේ පරිශීලනය සඳහා යොමු කිරීමටත් තීරණය කර ඇත. ඒ සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් හා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගෙන් විද්වත් ලිපි ලබා ගෙන ඇත.

මෙම උළෙල 2019 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ආරාධිතයන් 1500ක් පමණ සහභාගී වෙතැයි අපේක්ෂා කෙරේ. මෙම සම්මාන උළෙලේ සංවිධාන කටයුතු හා උළෙල පැවැත්වීම සඳහා 2018 වාර්ෂික අයවැයෙන් රු.මි. 10 ක් වෙන් කර ඇත.

**ජනාධිපති මාධ්‍ය සම්මාන 2018**

**සම්මාන ලබා දීමට යෝජිත ක්ෂේත්‍ර**

| | **සම්මාන ලබා දීමට යෝජිත ක්ෂේත්‍ර** | **සිංහල** | **ඉංග්‍රීසි** | **දෙමළ** | **පොදු** |
|---|---|---|---|---|---|
| 01 | පුවත්පත් ක්ෂේත්‍රය | 4 | 4 | 4 | 3 |
| 02 | රේඩියෝ ක්ෂේත්‍රය | 4 | 4 | 4 | 1 |
| 03 | ටෙලිවිෂන් ක්ෂේත්‍රය | 3 | 3 | 3 | 4 |
| 04 | වෙබ් අඩවි ක්ෂේත්‍රය | 1 | 1 | 1 | 3 |
| **එකතුව** | | **12** | **12** | **12** | **11** |
| **සම්මාන එකතුව** | | 47 | | | |
| **යාවජීව සම්මාන** | | 04 | | | |
| **මුළු සම්මාන සංඛ්‍යාව** | | 51 | | | |

| | සම්මාන ලබා දීමට යෝජිත ක්ෂේත්‍ර | සම්මාන සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| 1 | **පුවත්පත් ක්ෂේත්‍රය** | **සිංහල** | **ඉංග්‍රීසි** | **දෙමළ** | **පොදු** |
| 1.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව | ✔ | ✔ | ✔ | - |
| 1.2 | වසරේ ප්‍රශස්ත ඡායාරූපය | - | - | - | ✔ |
| 1.3 | වසරේ ප්‍රශස්ත තීරු ලිපිය | ✔ | ✔ | ✔ | - |
| 1.4 | වසරේ ප්‍රශස්ත කාටූන් නිර්මාණය | - | - | - | ✔ |
| 1.5 | වසරේ ප්‍රශස්ත පිටු සැලසුම | - | - | - | ✔ |
| 1.6 | වසරේ ප්‍රශස්ත විශේෂාංග ලිපිය | ✔ | ✔ | ✔ | - |
| 1.7 | වසරේ ප්‍රශස්ත විමර්ශනාත්මක පුවත | ✔ | ✔ | ✔ | - |
| **එකතුව** | | 4 | 4 | 4 | 3 |
| 2 | **ගුවන්විදුලි මාධ්‍ය ක්ෂේත්‍රය** | **සිංහල** | **ඉංග්‍රීසි** | **දෙමළ** | **පොදු** |
| 2.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව | - | - | - | ✔ |
| 2.2 | වසරේ ප්‍රශස්ත ගුවන් විදුලි වැඩසටහන | ✔ | ✔ | ✔ | - |
| 2.3 | වසරේ ප්‍රශස්ත ළමා වැඩසටහන | ✔ | ✔ | ✔ | - |
| 2.4 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන | ✔ | ✔ | ✔ | - |
| 2.5 | වසරේ ප්‍රශස්ත අධ්‍යාපනික වැඩසටහන | ✔ | ✔ | ✔ | - |
| **එකතුව** | | 4 | 4 | 4 | 1 |
| 3 | **ටෙලිවිෂන් ක්ෂේත්‍රය** | **සිංහල** | **ඉංග්‍රීසි** | **දෙමළ** | **පොදු** |
| 3.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව | ✔ | ✔ | ✔ | - |
| 3.2 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති නිවේදනය | ✔ | ✔ | ✔ | - |
| 3.3 | වසරේ ප්‍රශස්ත වැඩසටහන් ඉදිරිපත් කිරීම | ✔ | ✔ | ✔ | - |
| 3.4 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන | - | - | - | ✔ |
| 3.5 | වසරේ ප්‍රශස්ත වාර්තා වැඩසටහන | - | - | - | ✔ |
| 3.6 | වසරේ ප්‍රශස්ත සංවාදාත්මක වැඩසටහන | - | - | - | ✔ |
| 3.7 | වසරේ ප්‍රශස්ත අධ්‍යාපනික වැඩසටහන | - | - | - | ✔ |
| **එකතුව** | | 3 | 3 | 3 | 4 |
| 4 | **වෙබ් අඩවි ක්ෂේත්‍රය** | **සිංහල** | **ඉංග්‍රීසි** | **දෙමළ** | **පොදු** |
| 4.1 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වෙබ් අඩවිය | - | - | - | ✔ |
| 4.2 | වසරේ ප්‍රශස්ත වෙබ් වාර්තාකරණය | - | - | - | ✔ |
| 4.3 | වසරේ ප්‍රශස්ත බහු මාධ්‍ය භාවිතය | ✔ | ✔ | ✔ | - |
| 4.4 | වසරේ ප්‍රශස්ත බ්ලොග් (Blog) රචක | - | - | - | ✔ |
| **එකතුව** | | 1 | 1 | 1 | 3 |

## 04. "ඇසි දිසි" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිව ඇසිදිසි ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාවට නංවා ඇත. 2006 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහනින් දිවයිනේ පිළිගත් ජනමාධ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු මාධ්‍ය වෘත්තිකයින්ට උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සිදු කර ඇත. මේ යටතේ එක් ශිෂ්‍යත්වලාභියෙකුට රු.100,000ක උපරිම ශිෂ්‍යත්ව මුදලක් ප්‍රදානය කරනු ලබන අතර එය අදියර 3 කින් ගෙවනු ලැබේ.

2018 වර්ෂයේ මෙම වැඩසටහන සඳහා රු.මි. 2.5 ක ප්‍රතිපාදන ජාතික අයවැය මගින් වෙන්වී ඇත. එමගින් ජනමාධ්‍යවේදීන් 109 දෙනෙකු නව ශිෂ්‍යත්ව ලබා දීම සඳහා තෝරාගෙන ඇත.

| වර්ෂය | 2006-2017 | 2018 | එකතුව |
|---|---|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 739 | 109 | 848 |

## 05. "මාධ්‍ය අරුණ" 2018 ණය යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම සහ වෘත්තීය පහසු කරවීමේ අරමුණ පෙරදැරිව ජනමාධ්‍ය අමාත්‍යාංශය, මහජන බැංකුව හා ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. දිවයිනේ පිළිගත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල පූර්ණකාලීන හෝ අර්ධකාලීන පදනම මත වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කළ මාධ්‍යවේදීන්, නිදහස් මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සහ වෙබ් මාධ්‍යවේදීන්ට මාධ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පහත සඳහන් පරිදි ණය පහසුකම් ලබාදේ.

මෙමගින් පරිගණක (ලැප්ටොප්, ඩෙස්ක්ටොප්, අයිපෑඩ්) කැමරා, ෆැක්ස් යන්ත්‍ර, ඩිජිටල් පටිගත කිරීමේ යන්ත්‍ර හෝ ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නිර්දේශ කරන මාධ්‍ය උපකරණ මිලදී ගැනීම හෝ වැඩිදියුණු කිරීම කළ හැක.

| කාණ්ඩය | කාරණය | උපරිම ණය සීමාව | ණය ප්‍රතිලාභයට අදාළ පොළී අනුපාතව (වාර්ෂිකව) | රජයෙන් මහජන බැංකුව වෙත ගෙවන පොළී සහනාධාරය (වාර්ෂිකව) |
|---|---|---|---|---|
| කාණ්ඩ 01 | මාධ්‍ය උපකරණ මිලදී ගැනීම | 300,000/= | 0% | 100% පවතින පොළී අනුපාතයෙන් |
| කාණ්ඩ 02 | මාධ්‍ය උපකරණ වැඩිදියුණු කිරීම | 150,000/= | 50% පවතින පොළී අනුපාතයෙන් | 50% පවතින පොළී අනුපාතයෙන් |

| ණය කාණ්ඩය | වර්ෂය | මාධ්‍යවේදීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 2017 | 823 |
| 01 | 2018 | 554 |

**06. සහනදායී පදනම මත ජනමාධ්‍යවේදීන් සඳහා යතුරු පැදි ලබාදීමේ වැඩසටහන**

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය කටයුතු පහසු කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීමේ අරමුණින් ඔවුන්ට සහනදායී පදනම මත යතුරුපැදි ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇත. එමගින් ශ්‍රී ලංකාවේ පිළිගත් රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු මාධ්‍යවේදීන් මෙන්ම ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ද මෙම ව්‍යාපෘතිය යටතේ යතුරුපැදි ලබා ගැනීම සඳහා සහනදායී පොළී පදනමක් මත ණය මුදලක් මහජන බැංකුව මඟින් ලබා දීමට කටයුතු කර ඇත.

මේ යටතේ දෙනු ලබන උපරිම ණය මුදල රු. 250,000.00 කි. මාධ්‍යවේදීන්ගෙන් 2%ක පොළී අනුපාතයක් අයකර ගන්නා අතර ඉතිරි 7%ක ණය පොළිය භාණ්ඩාගාර අරමුදල් මඟින් ප්‍රතිපූරණය කෙරේ. ආපසු ගෙවීම් කාලය වසර 4 කි. 2018 දෙසැම්බර් මස 31 වන දින වන විට ණය ලබා දීම සඳහා සුදුසුකම් ලැබූ මාධ්‍යවේදීන් 330 දෙනෙකු සඳහා බැංකුව වෙතින් ණය මුදල් ලබා දී ඇත. රු.මි. 2.846 ක මුදලක් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කර ඇත.

**07. ජාතික ටෙලි සිනමා උද්‍යානය - රන්මිහිතැන්න**

ටෙලි සිනමා ශිල්පීන් සඳහා අවශ්‍ය පසුතල, මැදිරි සහ නවාතැන් පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් සලසා දීම අරමුණු කර ගනිමින් 2010 වර්ෂයේදී ආරම්භ කරන ලද රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය දේශීය සිනමා කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් පහසුකම් සැපයීමේ අරමුණින් ක්‍රියා කරනු ලබයි. මෙම උද්‍යානය ආශ්‍රිතව දේශීය කෙටි චිත්‍රපට, ටෙලි නාට්‍ය හා වෙළඳ දැන්වීම් රූගත කිරීම් සිදුවන අතර තරුණ පෙළ අතර මංගල ඡායාරූපකරණය සඳහා ටෙලි සිනමා උද්‍යානය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් දක්නට ඇත. දිනපතා මෙම උද්‍යානය නැරඹීම සඳහා පාසල් සිසුන් ඇතුළු විශාල පිරිසක් පැමිණෙන අතර 2018 වර්ෂය තුළ නරඹන්නන් 109,116 දෙනෙකු මෙම උද්‍යානය නැරඹීමට පැමිණ ඇත.

**2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ටෙලි සිනමා උද්‍යානයේ ආදායම හා වියදම**

| ආදායම් ප්‍රභවය | මුදල (රු.මි.) |
|---|---|
| ප්‍රවේශ පත්‍ර අලෙවිය | 4.906 |
| නවාතැන් පහසුකම් වෙන් කිරීමේ ගාස්තු හා රූගත කිරීම් සඳහා අයකිරීම | 1.127 |
| වෙනත් (ගොල්ෆ් රථයෙන් ලද ආදායම/මංගල ඡායාරූප හා වගා කටයුතු) | 3.489 |
| **එකතුව** | 9.522 |

2018 වාර්ෂික අයවැයෙන් ටෙලි සිනමා උද්‍යානය සඳහා රු.මි. 8 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර නඩත්තු කටයුතු හා මිලදී ගැනීම් සඳහා රු.මි. 6.32 ක් වැය කර ඇත.

රන්මිහිතැන්න ටෙලි සිනමා උද්‍යාන පදනම ස්ථාපිත කිරීමට අදාළ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

## 08. ගුවන් විදුලි හා රූපවාහිනි විකාශන බලපත්‍ර නිකුත් කිරීම

1966 අංක 37 දරණ ගුවන් විදුලි සංස්ථා පනතෙහි 44 වගන්තියේ ගරු අමාත්‍යතුමා වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව ගුවන් විදුලි බලපත්‍ර නිකුත් කිරීමද, 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 28 වෙනි වගන්තිය, 1988 අංක 43 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනතින් ගරු ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව හා අංක 1669/25 දරණ 2010.09.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීම ද මෙම අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි.

2018-12-31 දින වන විට නිකුත් කරන ලද බලපත්‍ර

| බලපත්‍ර වර්ගීකරණය | බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව |
|---|---|
| ගුවන්විදුලි | 21 |
| භෞමික රූපවාහිනී | 25 |
| සේවා සපයන ආයතන : | |
| කේබල් රූපවාහිනී | 09 |
| චන්ද්‍රිකා රූපවාහිනී | 08 |
| අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී | 02 |
| ජංගම දුරකතන මත පදනම් වූ රූපවාහිනී | 01 |
| **එකතුව** | **66** |

රාජ්‍ය ගුවන් විදුලි ආයතන දෙක වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රාදේශීය සේවාවන් ද ඇතුළුව ගුවන් විදුලි නාලිකා 22 ක් පවත්වාගෙන යනු ලබන අතර පෞද්ගලික ගුවන් විදුලි ආයතන 18 ක් සිය විකාශන කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව ගුවන් විදුලි නාලිකා 58 ක් පවත්වාගෙන යනු ලැබේ.

රාජ්‍ය රූපවාහිනී ආයතන දෙක හරහා රූපවාහිනී සේවාවන් 05 ක් පවත්වාගෙන යන අතර පෞද්ගලික රූපවාහිනී ආයතන 13 ක් විකාශන කටයුතු ආරම්භ කරමින් භෞමික රූපවාහිනී නාලිකා 18 ක් පවත්වා ගෙන යනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරිමය. විද්‍යුත් මාධ්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා පත්කරන ලද විද්වත් කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර මෙම ක්‍රමවේදය සඳහා මාධ්‍ය පාර්ශවකරුවන් සහ මහජන අදහස් විමසීමට නියමිතය.

## 09. ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම

අංක 12 /1037/37/019-1 සහ 13.08.2012 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සියලුම ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි විය යුතුය. සෑම වෙබ් අඩවියක්ම ලියාපදිංචි කිරීම සඳහා රු.25,000.00 ක් ද වාර්ෂික ලියාපදිංචිය අලුත් කිරීම සඳහා රු.10,000.00 ක මුදලක් ද අමාත්‍යාංශය වෙත ගෙවිය යුතුය. 2018 වර්ෂයේදී අමාත්‍යාංශය යටතේ ප්‍රවෘත්ති වෙබ් අඩවි 24 ක් ලියාපදිංචි කර ඇත.

**10. ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා බදු අය කිරීම**

2006 ජූනි මස 29 දිනැති අංක 1451/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග ප්‍රකාරව මෙරට මාධ්‍ය මගින් ආනයනය කොට විකාශනය කරනු ලබන ටෙලි නාට්‍ය, චිත්‍රපට හා විවිධ වාණිජ වැඩසටහන් සඳහා බදු අය කිරීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

**2018 වර්ෂයේදී බදු අයකරනු ලැබූ හා බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන්**

| වැඩසටහන් වර්ගය | බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | බදු අයකරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | බදු ආදායම (රු.මි.) |
|---|---|---|---|
| චිත්‍රපට | 476 | 169 | 23.20 |
| ටෙලි නාට්‍ය හා වාර්තා වැඩසටහන් | 1331 | 3903 | 587.75 |
| වෙළඳ දැන්වීම් හා වෙළඳ වැඩසටහන් | - | 82 | 47.00 |
| **එකතුව** | **1807** | **4154** | **657.95** |

**11. ටෙලි නාට්‍ය ප්‍රමිතිකරණය හා නියාමනය**

දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සියලුම රූපවාහිනී නාලිකා ඔස්සේ විකාශය කරන ටෙලි නාට්‍ය ප්‍රමුඛ අනෙකුත් වැඩසටහන් මඟින් සමාජයට වන අයහපත් බලපෑම් වැළැක්වීම සහ ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය රැකගැනීම සඳහා 2017.11.22 දින ගරු මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පවත්වන ලද පළමු කමිටු රැස්වීමේදී ඉදිරිපත් වූ යෝජනා හා අදහස් ද පදනම් කොට ගෙන ටෙලි නාට්‍ය ප්‍රමිතිකරණය හා නියාමනය පිළිබඳ අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

**12. අණ පනත් සහ සාංගමික ව්‍යවස්ථාවලි සංශෝධනය**

ජනමාධ්‍ය විෂය පථය යටතේ ඇති ආයතනවල අණපනත් / සාංගමික ව්‍යවස්ථාවලි අනාගතයට සුදුසු පරිදි සංශෝධනය විය යුතු බව හඳුනාගෙන ඇත. ඒ අනුව සංශෝධනයට ලක්විය යුතු අණපනත් / සාංගමික ව්‍යවස්ථාවලි පිළිබඳව පූර්ව අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී.

තවද වසර 30 කට පෙර ආරම්භ කර ඇති සැලසිනේ ආයතනය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම සඳහා 100% ක කොටස් රාජ්‍ය භාණ්ඩාගාරයට හිමිවන ලෙස ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

## 13. සැලසුම්කරණ කටයුතු

### අ) ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සඳහා මඟපෙන්වීම

- ජනමාධ්‍ය විෂය යටතේ පවතින ආයතනවල 2018 වර්ෂයේ ක්‍රියකාරී සැලසුම් හා 2018-2020 වර්ෂ සඳහා උපායමාර්ගික සැලසුම් හා සංයුක්ත සැලසුම් සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් පවත්වන ලදී.
- මීට අමතරව ආයතනවලින් ලැබී ඇති විශේෂ ඉල්ලීම් පරිදි එම ආයතනවල ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික සැලසුම් සකස් කිරීම පිළිබඳව සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.
- ජනමාධ්‍ය අංශයේ නිලධාරීන් හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශයේ දී වැඩසටහනක් පවත්වන ලදී.
- 2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලසුම් පිළිබඳව වර්ෂය අවසන් භාගයේ දී සමාලෝචනය කරන ලදී.

### ආ) කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම්

- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල පළමු, දෙවන, තෙවන කාර්තුවල ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අවසන් කර ඇත.
- දෙවන කාර්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම් අදාළ ආයතන පරිශ්‍රයන්හි දී පවත්වන ලදි.
- 2017 වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් 2018 වසර පළමු කාර්තුවේදී පවත්වන ලදී.

### ඇ) ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම

- රන්මිහිතැන්න ටෙලි සිනමා උද්‍යානය පිළිබඳව සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- වෘත්තීය ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බිහිකිරීමේ අරමුණින් ජාතික ජනමාධ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව සම්පාදනය කර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගන්නා ලදී.
- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වසන්තම් TV නාලිකාවේ ආවරණ කලාපය වැඩිදියුණු කිරීම පිළිබඳ ව්‍යාපෘති වාර්තාව සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතීන් ලබා ගන්නා ලදී.

### ඇ) වෙනත්

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ආවරණ කලාප පුළුල් කිරීම සඳහා අවශ්‍ය සංඛ්‍යාත පරාස ලබා දීම සඳහා කටයුතු කිරීම.

**14. ආයතනික**

රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන් හොඳින් දැනුම්වත් වීම හා නිපුණතාවයන් වර්ධනය කරගැනීම මගින් වඩාත් කාර්යක්ෂම කාර්යාල කළමනාකරණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමේ අරමුණ පෙරටු කොට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නිලධාරීන් 152 ක් දේශීය පුහුණු සඳහා ද 31 දෙනෙකු විදේශීය පුහුණු සඳහා ද යොමු කරන ලදී. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා දේශීය පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම සඳහා රු.මි. 2.98 ක් වැය කර ඇත.

**කාර්ය මණ්ඩල පුහුණු (දේශීය/විදේශීය) - 2018**

**දේශීය පුහුණු /පාඨමාලා :**


| අනු අංකය | පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | National Diploma in Digital Photography | 01 |
| 02 | ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව - i අදියර | 41 |
| 03 | ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව - ii අදියර | 40 |
| 04 | ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව - iii අදියර | 42 |
| 05 | මූලික විමර්ශනය පිළිබඳ වැඩමුළුව | 01 |
| 06 | ඩිජිටල් ඡායාරූපකරණ පාඨමාලාව | 01 |
| 07 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 | 16 |
| 08 | ඵලදායී සේවයක් සඳහා කාර්යක්ෂම ලේකම්වරියක් | 01 |
| 09 | පරිගණක සහතික පත්‍ර පාඨමාලාව (1, 11, වාරික) | 01 |
| 10 | සමාජ විද්‍යාපති පාඨමාලාව - කැළණිය විශ්ව විද්‍යාලය | 01 |
| 11 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව - පදනම් ආයතනය | 01 |
| 12 | ජනසන්නිවේදනය ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 03 |
| 13 | ශාස්ත්‍රපති පාඨමාලාව ගිණුම්කරණය හා ආර්ථික විද්‍යාව | 01 |
| 14 | MS Excel වැඩමුළුව - මිලෝදා ආයතනය | 01 |
| 15 | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (1 වාරිකය) - NIBM | 01 |
| | **එකතුව** | **152** |

**විදේශීය පුහුණු :**

| අනු අංකය | පුහුණු පාඨමාලාවේ නම | විදේශීය රට | සහභාගි වූ සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|---|
| 01 | International programme in Management | ඉන්දුනීසියාව | 01 | 8 |
| 02 | International programme in Management | ජපානය | 01 | 9 |
| 03 | International programme in Management | තායිලන්තය | 02 | 8 |
| 04 | International programme in Management | නෙදර්ලන්තය | 01 | 11 |
| 05 | International Programme on Enterprises Organization Management | තායිලන්තය | 01 | 07 |
| 06 | RTI Conference | ඉන්දියාව | 01 | 07 |
| 07 | Executive Leadership Development | මැලේසියාව | 01 | 07 |
| 08 | 2018 Seminar on Cooperation in Film, TV and Press for Sri Lanka under Belt & Road Initiative | චීනය | 02 | 35 |
| 09 | Capacity Builing Programme | මැලේසියාව | 01 | 8 |
| 10 | ADIB E Learning Programe | ජපානය | 01 | 4 |
| 11 | Basic Culture Immersion Programme | චීනය | 03 | 12 |
| | වෙනත් : | | | |
| 12 | ක්‍රිකට් තරඟාවලිය | මැලේසියා | 16 | 6 |
| | **එකතුව** | | 31 | |

15. **මානව සම්පත් කළමනාකරණය**

**සංවිධාන සටහන**




| | | අනුමත සේ.සං | සත්‍ය සේ.සං | | අනුමත සේ.සං | සත්‍ය සේ.සං |
|---|---|---|---|---|---|---|
| A | • ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර , සංවර්ධන නිලධාරී | 39 | 35 | • විමර්ශන නිලධාරී (විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය) | 13 | 12 |
| | • පර්යේෂණ නිලධාරී | 03 | 0 | • තාක්ෂණික සහායක | 01 | 0 |
| | • රාජ්‍ය කළමනාකරණ සහකාර | 22 | 12 | • පිළිගැනීමේ නිලධාරී | 01 | 0 |
| | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 04 | 01 | | | |
| B | • රියදුරු | 18 | 16 | **මුළු සේවක සංඛ්‍යාව** | **137** | **107** |
| | • කාර්යාල කාර්ය සහායක | 19 | 18 | | | |

**කාර්ය මණ්ඩල තොරතුරු - 2018.12.31 දිනට**

| තනතුර | සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු |
|---|---|---|---|
| | අනුමත | සත්‍ය | |
| අතිරේක ලේකම් (පාලන) | 1 | 1 | 0 |
| අතිරේක ලේකම් (සංවර්ධන, සැලසුම් හා තොරතුරු) | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | 2 | 1 | 1 |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ (මාධ්‍ය) | 1 | 0 | 1 |
| නි. අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 |
| නි. අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 0 | 1 |
| නි. අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) | 1 | 1 | 0 |
| සහකාර ලේකම් (පාලන) | 3 | 2 | 1 |
| ගණකාධිකාරී | 1 | 1 | 0 |
| නීති නිලධාරී | 1 | 1 | 0 |
| පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | 1 | 1 | 0 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 | 0 | 1 |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර / සංවර්ධන නිලධාරී | 39 | 35 | 4 |
| පර්යේෂණ නිලධාරී | 3 | 0 | 3 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 22 | 12 | 10 |
| විමර්ශන නිලධාරී (විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය) | 13 | 12 | 1 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 3 | 1 | 2 |
| තාක්ෂණික සහායක | 1 | 0 | 1 |
| පිළිගැනීමේ නිලධාරී | 1 | 0 | 1 |
| රියදුරු | 18 | 16 | 2 |
| කාර්යාල කාර්ය සහායක | 19 | 18 | 1 |
| **එකතුව** | **137** | **107** | **30** |

**ස්ථාන - මාරුවීම් 2018**

| තනතුර | ජනමාධ්‍ය අංශයට අනුයුක්ත කරන ලද | ජනමාධ්‍ය අංශයෙන් ස්ථානමාරු ලැබූ |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | - | 1 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | විශ්‍රාම ගැනීම |
| සංවර්ධන නිලධාරී | 3 | 5 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 5 | - |
| රියදුරු | 9 | 1 |
| කාර්යාල කාර්ය සහායක | 1 | 1 |

16. මූල්‍ය ප්‍රගතිය 2018 - මූලධන වියදම්

| විස්තරය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | |
|---|---|---|---|
| | මුළු වාර්ෂික ප්‍රතිපාදනය | 2018.12.31 දිනට සමුච්චිත වියදම | % |
| **01- පරිපාලන හා ආයතනික සේවා** | | | |
| මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | 9.80 | 6.83 | 70 |
| මූලධන වත්කම් අත්පත් කරගැනීම | 3.35 | 3.09 | 92 |
| ධාරිතා සංවර්ධනය | 25.00 | 15.00 | 60 |
| වෙනත් මූලධන වියදම් | 6.00 | 0 | 0 |
| භෞමික රූපවාහිනී විකාශනය අංකිත තාක්ෂණට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය* | 110.00 | 0 | 0 |
| රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GOSL/JICA) | 20.00 | 20.00 | 100 |
| පණ්ඩිත් අමරදේව සංගීත අසපුව ස්ථාපිත කිරීම | 225.00 | 44.53 | 20 |
| උප එකතුව | 399.15 | 89.45 | 22 |
| **ව්‍යාපෘතිය 02 - සංවර්ධන ක්‍රියාකාරකම්** | | | |
| **02 - පොදු ව්‍යාපාර සහ ආයතන** | | | |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 222.00 | 12.80 | 6 |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 160.00 | 72.40 | 45 |
| ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය | 10.00 | 0 | 0 |
| ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 4.00 | 3.30 | 83 |
| රන්මිහිතැන්න ටෙලි සිනමා උද්‍යානය | 8.00 | 2.73 | 34 |
| සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | 30.00 | 10.00 | 33 |
| උප එකතුව | 434.00 | 101.23 | 23 |
| **එකතුව** | **833.15** | **190.6** | **13** |

මූල්‍ය ප්‍රභවය : අයවැය ප්‍රතිපාදන

*භෞමික රූපවාහිනි විකාශන තාක්ෂණය අංකිත තාක්ෂණයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුව ඇත.

2018 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් වෙන්වූ මුදල රු.මි. 135.6 ක් වන අතර 2018.12.31 දිනට එහි වියදම රු.මි. 128.19 කි. මූල්‍ය ප්‍රගතිය 94.5% .

# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 1948 ජූනි මස 31 දින ආරම්භ කරන ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මගින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන අතර ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීමද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකී කාර්යභාරය සාක්ෂාත් කරගනු වස් දෙපාර්තමේන්තුව සිය කාර්ය මණ්ඩලය මෙහෙයවන අතර මෙහිදී එකී නිලධාරීන්ට සිය වගකීම් ඉටු කර ගැනීමට අවශ්‍ය කරන දැනුම, හැකියාව හා පරිසරය සකස් කර දෙනු ලැබේ.

මේ තුළ වැඩි අවධානයක් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු කෙරෙහි යොමු කෙරෙන අතර, දෙපාර්තමේන්තුවේ සියළුම අංශ එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස ක්‍රියාත්මක වේ.

**දැක්ම**

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම."

**මෙහෙවර**

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලී පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නගා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදු කරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම."

**අරමුණු**

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාව හා ඈඳුනු අරමුණු නම් ;

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම.
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරණ වැඩපිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත ගෙන යාම.
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

- මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම (කැබිනට් තීරණ දැනුම් දීම, වෙනත් අමාත්‍යාංශ හා ආයතන කාර්යභාරයට අදාළව)
- ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම.
- මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම.
- සංවර්ධන වැඩසටහන් පිළිබඳ ලිපි හා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම.
- නව මාධ්‍ය යොදාගෙන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම. (Face book, You tube, Twitter)
- දෙස් විදෙස් මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම.
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාළ අංශ දැනුවත් කිරීම.
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම.
- වාර්තා චිත්‍රපටි නිෂ්පාදනය හා ප්‍රචාරය.
- ජාතික උත්සව හා සංරක්ෂණ කටයුතු අවස්ථාවන් ආවරණය හා එකී අවස්ථා ඡායාරූප ගැනීම හා සංරක්ෂණය.
- අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් (මාධ්‍යවේදීන්, පාසල් සිසුන්, මාධ්‍ය ලේකම්වරුන්, අනෙකුත් පාර්ශව)

**2018.01.01 සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා වාර්තාමය වැඩසහන් 20ක්, දැන්වීම් 02ක්, හා ප්‍රවෘත්ති නිවේදන 249ක් නිෂ්පාදනය හා ප්‍රචාරය කිරීමට වියදම රු.මි. 2.483 කි.

- අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම්දීමේ සාකච්ඡා 29 ක් සංවිධානය කර ඇති අතර රජයේ මාධ්‍ය නිවේදන 34 ක් නිකුත් කිරීම, මාධ්‍ය සාකච්ඡා 57 ක් පැවැත්වීමට වියදම රු.මි. 4.35 කි.

- විවිධ අමාත්‍යාංශයන්හි මාධ්‍ය ආවරණ කටයුතු 219 ක් ද සංවර්ධන ව්‍යාපෘති 8 ක මාධ්‍ය ආවරණද සිදු කර ඇත.

- කාලීන විෂයන් පිළිබඳව මාධ්‍යවේදීන්, මාධ්‍ය ලේකම්වරු දැනුවත් කිරීමේ වැඩසටහන් 19ක් පැවත්වීම සඳහා වියදම රු.මි. 5.2 කි.

- විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ ශ්‍රී ලංකා නිල සංචාර 6 ක් ආවරණය කිරීමට වියදම රු.මි. 0.6 කි.

- රජය විසින් කාලානුරූපීව සිදු කරන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව ජනතාව අවදි කිරීමත්, එකී කාර්යයන් පිළිබඳ පුළුල් කතිකාවතක් ඇති කිරීමටත් **"දෙසතිය"** සිංහල පුවත් සඟරාවත් **"තිංගල්"** දමිළ සඟරාවත් දායක වන අතර 2018 වර්ෂය තුළ "දෙසතිය" කලාප 14 ක්ද "තිංගල්" කලාප 1 ක්ද එළිදැක්වීම සඳහා වියදම රු.මි. 2.93 කි.

- පෞරාණික වැදගත්කමක් හා අධ්‍යාපනික වැදගත්කමක් සහිත වැඩසටහන් හා ඡායාරූප දෙපාර්තමේන්තුව සතුව පවතී. මෙම තොරතුරු අවශ්‍ය වූ විට මහජන පරිහරණයට ලබාදේ. එහෙත්

එම තොරතුරු ඉදිරි පරපුර සඳහා නව තාක්ෂණය භාවිතයෙන් සංරක්ෂණය කිරීමට, ඩිජිටල් පුස්තකාලයක් සැකසීමට සැලසුම්කර ඇත.

- මහජනතාව රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව හා රජයේ පණිවුඩ පිළිබඳව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ, Facebook, Twitter, Youtube මගින් ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ලෙසද, කෙටි පණිවුඩ මගින්ද දැනුවත් කෙරේ.

**2018 වසරේ ප්‍රාග්ධන ව්‍යාපෘති**

- ශ්‍රව්‍ය අංශය වෙත VRF වර්ගයේ වායුසමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම හා නවීණ උපකරණ මිලදී ගැනීම.
- 4K HD කැමරා, දෘෂ්‍ය මිශ්‍රක (Vision Mixer) හා සංස්කරණ පද්ධති (Editing System) 2ක් ස්ථාපිත කිරීම සඳහා වියදම රු.මි. 6.4 කි.
- DVD පුස්තකාලයක් සහ සංරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වියදම රු.මි. 4.40 කි.
- රජයේ චිත්‍රපට අංශය සඳහා විද්‍යුත් උපකරණ මිලදී ගැනීම සඳහා වියදම රු.මි. 4.10 කි.

**මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම**

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| දේශීය මාධ්‍යවේදීන් | 2158 |
| විදේශීය මාධ්‍යවේදීන් | 171 |
| මාධ්‍ය නිලධාරීන් | 700 |
| වෙබ් මාධ්‍යවේදීන් | 194 |
| ප්‍රාදේශීය මාධ්‍යවේදීන් | 1452 |
| ඡායාරූප මාධ්‍යවේදීන් | 149 |
| රූපවාහිනී මාධ්‍යවේදීන් | 263 |
| නිවේදන ශිල්පීන් | 167 |
| මාධ්‍ය නිලධාරීන් | 437 |
| මාධ්‍ය පරිපාලකයින් | 70 |
| ටෙලි නිර්මාණ ශිල්පීන් | 18 |
| විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම් | 98 |
| රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු නිලධාරින් | 9 |
| **එකතුව** | **5886** |

**මූල්‍ය ප්‍රගතිය 2018**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන හා වියදම** (රු.මි.)

| අයිතමය | ඇස්තමේන්තුව | වියදම | ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්තන | 602.29 | 515.32 | 86% |
| ප්‍රාග්ධන | 146.14 | 45.29 | 31% |
| **එකතුව** | **748.43** | **560.61** | **75%** |

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

## හැඳින්වීම

1949 ඔක්තෝබර් 01 වැනි දින ගුවන් විදුලි දෙපාර්තමේන්තුව නැමැති ස්වාධීන ආයතනයක් වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලද මෙම ආයතනය 1972 මැයි 22 ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමග ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලෙස නාමය වෙනස් කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ගුවන් විදුලි සන්නිවේදනයේ ප්‍රමුඛතම පුරෝගාමී මාධ්‍ය ජාලය ලෙස ශ්‍රාවකයන් කේන්ද්‍රගත කරමින් ඒ ඒ සමාජ අවශ්‍යතා හඳුනා ගනිමින් "පහසුකම් සපයන්නෙකු" ලෙස ජනතාවගේ අනේකවිධ අවශ්‍යතා ඉටුකරන විද්‍යුත් මාධ්‍ය ජාලය බවට පත්ව ඇත. දිගු තරංග, මධ්‍යම තරංග, කෙටි තරංග සහ FM තරංග මාලා ඔස්සේ දේශීය විකාශන ජාලය තුළ ජාතික නාලිකා 06 කින්, ප්‍රාදේශීය සේවා 07 කින් සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවකින් සමන්විතව විකාශන කටයුතු සිදුකරනු ලබන අතර ගුවන් විදුලි සංස්ථාව සතු ප්‍රධාන විකාශන මධ්‍යස්ථාන 09 මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි විකාශන කටයුතු සිදුවේ. මීට අමතරව පුත්තලම හා ත්‍රිකුණාමලය යන ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන මගින් විදේශීය විකාශන කටයුතු සිදුකරනු ලබයි. විශ්වාසනීය හා අවංක මාධ්‍ය මෙහෙවරක නියුතු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ශ්‍රාවකයාට වඩාත් සමීප වීම පිණිස තම වෙබ් අඩවිය ඔස්සේ ජාත්‍යන්තරය යාකිරීමේ මාර්ගයට ද ප්‍රවේශ වී ඇත.

මීට අමතරව ගුවන් විදුලි සන්නිවේදනය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික අභ්‍යාස පාඨමාලාවන් පවත්වනු ලබන පුහුණු ආයතන 2 ක් ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් පාලනය වේ.

## දැක්ම

යහපත් විද්‍යුත් මාධ්‍ය සංස්කෘතියක් සඳහා පරමාදර්ශ සැපයීම.

## මෙහෙවර

බහු ජාතික, බහු භාෂාමය, බහු ආගමික, සමාජයක සංහිඳියාව, ආර්ථික සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදී හර පද්ධති ශක්තිමත් වන පුද්ගල සංවර්ධනය උදෙසා මාධ්‍ය මෙහෙවරක යෙදීම.

## අරමුණු

- ලොවපුරා හටගන්නා දේශපාලන, ආර්ථික සහ සමාජීය වැදගත්කමක් සහිත සිදුවීම් පිළිබඳ තොරතුරු රැස්කර නිරවුල්ව ජනතාවට බෙදා දීම.
- ජනතාව ජීවත්වන පරිසරය තුළ සමාජයේ ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස ක්‍රියාත්මක වීමට ඉඩ හසර සලසන පොදු දැනුම රැස්කර ගැනීමට අවශ්‍ය ඉඩ සැලසීම.
- සමාජය උදෙසා පොදු දැනුම් අරමුදලක් ගොඩනැගීම.
- මිනිසාගේ පැවැත්ම සඳහා වූ අභියෝග හඳුනාගෙන ඒවාට අවශ්‍ය කෙරෙන දැනුම සම්පාදනය කිරීම.
- සමාජයේ කඩිනම් හා අවසාන අරමුණු ප්‍රවර්ධනය සඳහා අභිප්‍රේරණය.
- පොදු කාරණා පිළිබඳ මූලික කරුණු නිර්වචනය, නිරවුල් කිරීමට උපකාරී වීම.
- පුද්ගලයා සතු කුසලතා, චරිත හා බුද්ධිමය සංවර්ධනය සඳහා වූ දැනුම ලබාදීම හා උත්ප්‍රේරණය.
- ජාතික හෝ ජන කොට්ඨාශයක සංස්කෘතිය හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම.
- විනෝදාස්වාදය සඳහා කටයුතු කිරීම.
- විවිධ ජනකණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධයෙන්, සහජීවනය සහ ගෞරවය ඇතිකිරීම සඳහා කටයුතු කිරීම.
- නව තාක්ෂණික වෙනස්කම් යාවත්කාලීන කොට ක්‍රියාවට නැංවීම.

**සංස්ථාවේ කාර්යභාරය**

1966 අංක 37 දරණ ගුවන් විදුලි සංස්ථා පනත අනුව සංස්ථාවේ කාර්යභාරය වනුයේ,

- සංවර්ධන, පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් සිදුකරමින් ශ්‍රී ලංකාව තුළ ගුවන් විදුලි සේවා පොදු ජනතාවගේ සුබසිද්ධිය සඳහා පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් විකාශය කරනු ලබන වැඩසටහන් අධීක්ෂණය හා පාලනය.
- විකාශන කටයුතු සඳහා මෙම පනත යටතේ ලබාදී ඇති බලතල සහ වගකීම් භාවිත කිරීම.
- ගුවන් විදුලි විකාශන කටයුතු සම්බන්ධව අමාත්‍යතුමාට අවශ්‍ය උපදෙස් ලබා දීම.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

**ආයතනික අංශය**

- සංස්ථාවේ යෝජිත සේවක සංයුතිය අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අනුමත සේවක සංයුතිය අනුව බඳවා ගැනීම් පරිපාටි 13 ක් කෙටුම්පත් කර ඇත.
- සංස්ථාව පරිහරණය කරන ඉඩම් නිරවුල් කර ගැනීම.

  කලටුවාව ඉඩමේ ඇති සම්ප්‍රේෂණ කුළුණ සඳහා බිම් කුලිය අයකර ගැනීම.

  ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ හිමිකම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

  නුවරඑළිය "නිවහන" ඉඩමේ මැනීම් කටයුතු අවසන් කිරීම.

  යාල් FM සේවය ස්ථාපිත කිරීමට යෝජිත ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කිරීම.

**අභ්‍යාස අංශය**

සංස්ථා අභ්‍යාස ආයතනයේ පවත්වන ලද වැඩසටහන්

| **ක්‍රියාකාරකම** | **සහභාගීත්වය** | |
|---|---|---|
| ගුවන්විදුලි නිෂ්පාදන හා සන්නිවේදන සහතිකපත්‍ර පාඨමාලාව | අභ්‍යාසලාභීන් | 17 |
| දෙමළ නිවේදක නිවේදිකාවන්ගේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර ලකුණු කිරීම. | නිලධාරීන් | 22 |
| ඉංග්‍රීසි සහන නිවේදක පුහුණුව | නිලධාරීන් | 20 |
| ජාතික ආධුනිකත්ව සහ පුහුණුකිරීමේ අධිකාරියේ පුහුණුව | අභ්‍යාසලාභීන් | 20 |
| රාජකීය විද්‍යාලයේ මාධ්‍ය අංශයේ සිසුන් සඳහා පුහුණුව | ශිෂ්‍යයන් | 10 |
| ගුවන්විදුලි නිෂ්පාදන හා සන්නිවේදන සහතිකපත්‍ර පාඨමාලාව (සතියේ දින) | අභ්‍යාසලාභීන් | 21 |
| ගුවන්විදුලි නිෂ්පාදන හා සන්නිවේදන සහතිකපත්‍ර පාඨමාලාව (සති අන්ත දින) | අභ්‍යාසලාභීන් | 15 |
| සිංහල නිවේදක නිවේදිකා ප්‍රතිපෝෂණ වැඩමුළුව | නිලධාරීන් | 19 |
| සහන නිවේදක පුහුණුව | නිලධාරීන් | 05 |
| ක්‍රීඩා විස්තර විචාරකයන් සඳහා පුහුණු වැඩමුළුව | නිලධාරීන් | 13 |
| දෙමළ නිවේදක නිවේදිකාවන් සඳහා ප්‍රතිපෝෂණ සැසිය | නිලධාරීන් | 19 |
| පිළිගැනීමේ නිලධාරීන් සඳහා පුහුණුව | නිලධාරීන් | 04 |
| ඉංග්‍රීසි නිවේදක නිවේදිකාවන්ගේ ප්‍රතිපෝෂණ සැසිය | නිලධාරීන් | 03 |
| City FM සේවය සඳහා විශ්වවිද්‍යාල සිසුන්ගේ නිවේදක පුහුණුව | සිසුන් | 17 |

| | | |
|---|---|---|
| ඉංග්‍රීසි නිවේදක නිවේදිකාවන් සඳහා භාෂා භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව | නිලධාරීන් | 10 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සීමාවාසික පුහුණුව | සිසුන් | 05 |
| ඉහළ කළමනාකරුවන් සහ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා කොත්මලේ හොලිඩේ රිසෝට්හි දී පැවති වැඩමුළුව | නිලධාරීන් | 27 |
| ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා නිලධාරීන්ගේ මහජන ඇමතුම් පුහුණු පාඨමාලාව | නිලධාරීන් | 15 |
| සමාජ මාධ්‍ය ඔස්සේ වැඩසටහන් ප්‍රවර්ධන කිරීම සම්බන්ධ පුහුණු වැඩමුළුව | නිලධාරීන් | 30 |
| ශ්‍රවණ තත්ත්වය ඇගයීමේ වැඩමුළුව | නිලධාරීන් | 30 |
| විගණන අංශයේ නිලධාරීන් සඳහා පුහුණුව - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | නිලධාරීන් | 01 |
| ඉහළ සහ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා පැවැත්වූ පුහුණු වැඩමුළුව - හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය | නිලධාරීන් | 22 |
| ගුවන් තොටුපොළ සහ ගුවන්සේවා නිලධාරීන්ගේ මහජන ඇමතුම් පාඨමාලාව | නිලධාරීන් | 15 |
| සිංහල සහන නිවේදක නිවේදිකාවන්ගේ ස්වයංක්‍රිය මැදිරි පුහුණුව | නිලධාරීන් | 12 |
| **එකතුව** | | **372** |

**විදේශීය පුහුණු**

| **පුහුණු පාඨමාලාව** | **සහභාගීත්වය** | |
|---|---|---|
| කර්මාන්තශාලා පුහුණුව - ඉතාලිය | කාර්මික නිලධාරීන් | 03 |
| Radio & Television for Medium & Senor Level Managers සම්මන්ත්‍රණය - චීනය | විධායක නිලධාරීන් | 02 |
| කර්මාන්ත ශාලා පුහුණුව - තායිලන්තය | නිලධාරීන් | 01 |
| කර්මාන්තශාලා පුහුණුව - ඉතාලිය | නිලධාරීන් | 03 |
| කර්මාන්තශාලා පුහුණුව - ස්පාඤ්ඤය | නිලධාරීන් | 03 |
| **එකතුව** | | **12** |

**වැඩසටහන් අංශය**

| | ගුවන්විදුලි සේවය සහ වැඩසටහන් විෂය පථය | භෞතික (වැඩසටහන්) | | මූල්‍ය (රු.මි.) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| 1 | City FM **සේවය** | | | | |
| | නව ශ්‍රාවකයින් ග්‍රහනය කර ගත හැකි අයුරින් නිර්මාණශීලී වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කිරීම | 3192 | 3192 | | |
| | සේවාදායක අනුග්‍රහය සහිත වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කිරීම | 2178 | 1900 | 80 | 75 |
| | සමාජ සංස්කෘතික වටිනාකම් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම | 1428 | 1428 | | |
| | ශ්‍රාවකයින්ගේ උසස් රසවින්දනය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම සහ විකාශය කිරීම | 804 | 804 | | |
| 2 | **වෙළඳ සේවය** | | | | |
| | නව ශ්‍රාවකයින් ග්‍රහනය කර ගත හැකි අයුරින් නිර්මාණශීලී වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කිරීම | 1682 | 1682 | 02 | 1.2 |
| | සේවාදායක අනුග්‍රහය සහිත වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කිරීම | 413 | 413 | 07 | 2 |
| 3 | **මුස්ලිම් සේවය** | | | | |
| | සමාජ සංස්කෘතික වටිනාකම් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම | 374 | 374 | | 69.07 |
| 4 | **දෙමළ සේවය** | | | | |
| | සමාජ සංස්කෘතික වටිනාකම් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම | 704 | 704 | | |
| 5 | **තෙන්ඩ්‍රල් සේවය** | | | | |
| | සමාජ සංස්කෘතික වටිනාකම් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම | 557 | 557 | 5.45 | 5.45 |

අලෙවි අංශය

| | අයිතමය | ඒකකය | සංඛ්‍යාව | ඉලක්කය (රු.ලක්ෂ) | ප්‍රගතිය (රු.ලක්ෂ) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| i. | බහුවිධ සේවා දායකත්වය ලබා ගැනීම | | | | | |
| | පැයේ උණුසුම් පුවත් සම්පිණ්ඩනය | ප්‍රවෘත්ති ප්‍රකාශ | 3600 | 122 | 138 | 133 |
| | ප්‍රධාන පුවත් ප්‍රකාශයට | | | | | |
| | සංවර්ධන පුවත් | ප්‍රවෘත්ති ප්‍රකාශ | 1440 | 61 | 66 | 108 |
| | ව්‍යාපාරික පුවත් | ප්‍රවෘත්ති ප්‍රකාශ | 1440 | 40 | 60 | 150 |
| | කාලගුණ වාර්තාව සම්බන්ධ කිරීම | ප්‍රවෘත්ති ප්‍රකාශ | 1440 | 40 | 16 | 40 |
| ii. | තත්පර 10 දැන්වීම් බහුතරයක් මගින් සන්නාම ප්‍රවර්ධනය | වැඩසටහන් | 14400 | 65 | 40 | 62 |
| iii. | ප්‍රවෘත්ති ආසන්න තත්පර 30 දැන්වීම් | ප්‍රවෘත්ති ප්‍රකාශ | 1440 | 113 | 311 | 275 |
| iv. | ස්වදේශීය සේවය පෝදා වැඩසටහන් - පූජා | වැඩසටහන් | 12 | 61 | 46 | 75 |
| v. | ගවේෂණාත්මක සාකච්ඡාමය වැඩසටහන "සාර ප්‍රභාගිර" | වැඩසටහන් | 360 | 61 | 29 | 48 |
| vi. | පැයේ ජනප්‍රිය ගීතය, සිනමා ගී, ළමා ගී, යුග ගී, වශයෙන් බණ්ඩනය කර ගීත ප්‍රචාරය | වැඩසටහන් | 10800 | 61 | 49 | 80 |
| vii. | කාලීන වැඩසටහන් - සුසාරති හා විදුයම් වෙලායි | වැඩසටහන් | 720 | 183 | 202 | 110 |
| viii. | ඉස්ලාම් ආගමික වැඩසටහන් - අසාන් | වැඩසටහන් | 1800 | 101 | 102 | 101 |
| ix. | ගුවන් විදුලි නාට්‍ය | වැඩසටහන් | 96 | 203 | 25 | 12 |
| x. | ගීත රචකයෙක් විසින් ගීත විවරණය - මිහිර මනරම් | වැඩසටහන් | 12 | 38 | 36 | 95 |
| xi. | වේලාව ප්‍රකාශ කිරීම් (Time Checks) | Time Checks | 3600 | 121 | 69 | 57 |
| xii. | ආයතනික සාමූහික ප්‍රතිබිම්භ ප්‍රවර්ධනය | වැඩසටහන් | 8 | 203 | 107 | 53 |

ඉංජිනේරු අංශය

| ව්‍යාපෘතිය සහ මුළු ඇස්තමේන්තුව (රු.මි.) | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | |
|---|---|---|---|---|
| | ප්‍රගතිය | % | වාර්ෂික ප්‍රතිපාදන | වියදම |
| **භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් සිදුකල ප්‍රාග්ධන ව්‍යාපෘති** | | | | |
| යාල් FM සේවය සඳහා මැදිරි සංකීර්ණයක් ස්ථාපිත කිරීම (රු.මි. 42.50) | අදාළ ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම නිසා ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. මැදිරි සඳහා අවශ්‍ය IP Audio Codes 09 ක් මිලදී ගෙන ඇත. | 5 | 42.5 | 3.4 |
| ප්‍රධාන කාර්යාලයේ සම්බන්ධතා මැදිරි C1 - C12 හා බහුකාර්ය මැදිරි යාවත්කාලීන කිරීම - අදියර II (රු.මි. 77.16) | උපකරණ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පිරිනමා ඇත. C1 – C6 දක්වා වූ සම්බන්ධතා මැදිරි යාවත්කාලීන කෙරේ. | 50 | 17.16 | 14.0 |
| පරිගණක ජාල ව්‍යාපෘතිය - අදියර II (රු.මි. 319.69) | ටෙන්ඩර් පිරිනැමීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී ඇත. | 50 | 110 | 10 |
| කොළඹ හා යටියන්තොට FM සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය සඳහා ශ්‍රව්‍ය සකසන (Audio Processor) 6 ක් මිලදී ගැනීම (රු.මි. 7.0) | ශ්‍රව්‍ය සැකසුම් උපකරණ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. | 50 | 7 | - |
| ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා වායුසමීකරණ සහ විදුලි අවශ්‍යතා සපුරා ගැනීම. (රු.මි. 10.0) | වායුසමීකරණ යන්ත්‍ර 15 ක් මිලදී ගෙන ඇත. විදුලි අවශ්‍යතා සපුරාලීම සහ එම යන්ත්‍ර ස්ථාපනය කිරීම සිදු කෙරේ. | 75 | 10 | 7.2 |
| නුවරඑළිය ''නිවහන'', කොත්මලේ මාධ්‍ය ඇකඩමිය සහ අඹේවෙල නිවාඩු නිකේතනය නවීකරණය (රු.මි. 6.0) | ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. | 50 | 7.6 | 7.6 |
| විකාශනාගාර / මැදිරි / බාහිර ප්‍රචාරක (OB – Outside Broadcasting) යන අංශ සඳහා උපකරණ හා අමතර උපාංග මිලදී ගැනීම (රු.මි. 5.2) | උපකරණ ඇණවුම් කර ඇත. | 90 | 5.2 | 2.1 |
| උපාංග සහිත පරිගණක මිලදී ගැනීම (රු.මි. 5.34) | ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. | 50 | 5.34 | 5.3 |
| මූල්‍ය අංශය සඳහා ගිණුම්කරණ මෘදුකාංගයක් (Accounting Software) මිලදී ගැනීම. (රු.මි. 3.1) | මිල ගණන් කැඳවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | 100 | 3.1 | 3.1 |

| 2017 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘතිය සහ මුළු ඇස්තමේන්තුව (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | |
| | | වාර්ෂික ප්‍රතිපාදන | ප්‍රගතිය | % |
| හපුතලේ FM සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය යාවත්කාලින කිරීම - අදියර II (රු.මි. 191.75) | උපකරණ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පිරිනමා ඇත. | 4.9 | 4.9 | 100 |
| කඳුරට සේවය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය (රු.මි. 10.0) | මැදිරි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 10.0 | 7.9 | 75 |

**ශ්‍රවණ පර්යේෂණ අංශය**

- ගුවන්විදුලි සංස්ථාවේ සේවාවන්හි ශ්‍රවණ තත්වය පිළිබඳ තැපැල් හා දුරකථන මාර්ගික සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය කර අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත.
- මාධ්‍ය භාවිතය පිළිබඳ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා තැපැල් හා දුරකථන මාර්ගික සමීක්ෂණ, ශ්‍රාවක සමාජ පිහිටුවීම සහ සේවාවන්හි ප්‍රචාරය වන හා ප්‍රචාරය වූ වැඩසටහන් ඇගයීම 2018 වසරේ ඉටු කිරීමට සැලසුම් කර තිබුනද ගුවන් විදුලි සේවා ප්‍රතිසංවිධානය කිරීම කාලීන අවශ්‍යතාවයක් වූ බැවින් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.
- වැඩසටහන්වලට අවශ්‍ය දෛනික තොරතුරු රැස්කර ලේඛණගත කර අදාළ සේවාවන්ට තොරතුරු ඇතුළත් වාර්තා 92 ක් ලබා දී ඇත.
- ගුවන්විදුලිය නරඹන්නන්ට අත් පත්‍රිකාවක් හා ගුවන්විදුලිය පිළිබඳ පොත් පිංචක් සකස් කිරීමට කටයුතු කර ඇත.
- ගුවන්විදුලි සේවා ප්‍රතිසංවිධානය කිරීම සඳහා සිංහල වෙළඳ සේවය පිළිබඳ තැපැල් සමීක්ෂණයක් පවත්වා ශ්‍රාවක අදහස් හා යෝජනා ලබා දී ඇත.
- වැඩසටහන් සඳහා අවශ්‍ය කාලීන මාතෘකා පිළිබඳ වාර්තා 61 ක් ඉදිරිපත් කර ඇත.

**2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පුනරාවර්තන වියදම් සඳහා රු.මි. 360 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.මි. 222ක් ද ලෙස රු.මි. 582 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙන් කරන ලදී.

| අයිතමය | (රු.මි.) |
|---|---|
| ආදායම | 988.26 |
| වියදම | (1368.39) |
| ලාභය /අලාභය | (380.13) |
| පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන | 360.00 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන ඇතුළත්ව ලාභය / අලාභය | (20.13) |
| බදු | (28.00) |
| වෙනත් විස්තීරණ ආදායම | 8.65 |
| බදු පසු ලාභය / අලාභය | (39.48) |

**2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්**

- යාල් එෆ් එම් සේවය සඳහා මැදිරි සංකීර්ණයක් ඉදිකිරීම.
- දේශීය හා විදේශීය ගුවන් කාල අලෙවි වර්ධනය කිරීම හා ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම තුළින් සංස්ථාවේ ආදායම් තත්වය ඉහළ නැංවීම.
- පුහුණු වැඩසටහන් තුළින් සංස්ථාවේ ආදායම ප්‍රවර්ධනය.
- නව ශ්‍රාවකයන් ග්‍රහණය කර ගත හැකි අයුරින් නිර්මාණශීලී වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කිරීම.
- ශ්‍රාවක සමාජ පිහිටුවීම.
- සංස්ථාවේ යෝජිත සේවක සංයුතිය හා අදාළ බඳවාගැනීම් පටිපාටි අනුමත කර ගැනීම හා සේවක අන්තර්ග්‍රහනය කිරීම.
- කොළඹ සහ යටියන්තොට විකාශනාගාර සඳහා Audio Processers 8 ක් ස්ථාපනය කිරීම - II අදියර
- තොරතුරු තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතියේ III අදියර ක්‍රියාත්මක කිරිම.
- ප්‍රාදේශීය සේවාවන් සඳහා ස්ටීරියෝ වැඩසටහන් සම්බන්ධක 6 ක් මිලදී ගැනීම.
- ගුවන්විදුලි මාධ්‍ය භාවිතය පිළිබඳ දීපව්‍යාප්ත ක්ෂේත්‍ර සමීක්ෂණය.

# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

**හැඳින්වීම**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මගින් පිහිටුවනු ලැබීය. මෙරට රූපවාහිනී ප්‍රචාරක සේවයක් පවත්වාගෙන යාමේ කාර්යය සහ එම සේවය සංවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කරුණු සඳහා ද අදාළ පනතෙන් විධිවිධාන සලසා ඇත. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශනය කිරීම සිදු වේ. සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින රූපවාහිනී තාක්ෂණයට අනුගත වෙමින් ප්‍රේක්ෂකයින් වෙත උසස් තත්වයේ නිර්මාණයන් ළඟා කර දීම සඳහා ජාතික නාලිකාව වශයෙන් ජාතික වගකීමක් ඉටු කරනු ලැබේ. දශක තුනක කාලයක් තුළ දෙස් විදෙස් සම්මානයට පාත්‍ර වූ උසස් තත්වයේ වැඩසටහන් නිපදවමින් හා ප්‍රවෘත්ති සැපයීමෙන් ප්‍රේක්ෂකයින්ගේ රසඥතාව හා දැනුම ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හැකිව තිබේ. එමෙන්ම රට තුළ සිදුවන සංවර්ධනය පිළිබඳව **රූපවාහිනී, Eye** හා **නේත්‍රා** නාලිකා ඔස්සේ විවිධ භාෂා කථා කරන ජනතාව දැනුවත් කරමින් රාජ්‍ය මාධ්‍ය ආයතනයක කාර්යභාරය ඉටු කිරීමට ද  රූපවාහිනී සංස්ථාව කටයුතු කර තිබේ.

**දැක්ම**

"ඇසි දිසි මාධ්‍යයේ නිබඳ ශ්‍රී ලාංකේය මුද්‍රාව"

**මෙහෙවර**

"දැනුම, විනෝදය, අධ්‍යාපනය සපිරි කාලෝචිත අර්ථපූර්ණ ප්‍රතිභාසම්පන්න වැඩසටහන් කැපවීමෙන් යුතුව එක්සත්ව නිර්මාණය කර නව තාක්ෂණයෙන් ඔප්නැංවී සිව් දෙස විසිරි ශ්‍රී ලාංකිකයන්ගේ අපේක්ෂා අභිබවමින් විසුරුවා හැරීම"

**අරමුණු**

- රූපවාහිනී වැඩසටහන්වල ආකෘතිමය වෙනස්කම් තුළින් ආකර්ශනීයභාවය, විවිධත්වය හා අර්ථපූර්ණභාවය වැඩිදියුණු කිරීම.
- නව තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් ප්‍රේක්ෂකයන් වෙත පහසුවෙන් ළඟා වීම.
- ආයතනයේ භෞතික හා මානව සම්පත් ඵලදායී ලෙස වැඩි දියුණු කිරීම.
- ආයතනයට අතිරේක ආදායම් උත්පාදන මාර්ග හඳුන්වාදීම.
- තරඟකාරිත්වයට ගැළපෙන පරිදි ආයතනයේ ව්‍යවස්ථාපිත රාමුව සංශෝධනය කිරීම.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

**1. ජපන් රජයේ සංස්කෘතික ආධාර යටතේ රූපවාහිනී සංස්ථාවේ වැඩසටහන් වැඩිදියුණු කිරීම**

ජපන් රජයේ සංස්කෘතික හුවමාරු වැඩසටහන යටතේ ශ්‍රී ලාංකේය රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව එම රජය සමඟ ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව JICA ආයතනය විසින් 2017 සැප්තැම්බර් මස රු.මි. 73.6 ක් වටිනා NHK ජපන් අධ්‍යාපනික වාර්තා වැඩසටහන් 449 ක් අඩංගු XD Cam තැටි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පුස්තකාලය වෙත පිරිනැමීය. මෙම වැඩසටහන් ඉදිරි වර්ෂ 04 තුළ ඉංග්‍රීසි භාෂාවෙන් ද, සිංහල හඬකවා දෙමළ උපසිරැසි සහිතව ද දෙමළ හඬකැවීම් කර තෙවරක් ද විකාශය කළ යුතුව ඇත.

හඬකැවීම්, උපසිරැසි ගැන්වීම් සහ පූර්ව ප්‍රචාරක පට සෑදීම වෙනුවෙන් ප්‍රතිපාර්ශවීය අරමුදල් ලෙස රු.මි. 42.7 ක් වෙන් කර ඇති අතර එම මුදලෙන් රු.මි. 20 ක් 2017 වර්ෂයේදීද රු.මි. 20.23 ක් 2018 වර්ෂයේදීද ජාතික රූපවාහිනියට ලබා දී ඇත.

2017 සැප්තැම්බර් මස සිට බලාත්මක කරන ලද මෙම ගිවිසුමට අනුව, 2018 වර්ෂය ආරම්භයේ සිට මෙම වැඩසටහන් විකාශය කිරීමට අවශ්‍ය හඬකැවීම්, උපසිරැසි ගැන්වීම් හා පූර්ව ප්‍රචාරක පට සැකසීම සිදුකර ඇත. ඒ අනුව දෙමළ භාෂාවෙන් වැඩසටහන් 218ක් ද ඉංග්‍රීසි භාෂාවෙන් වැඩසටහන් 95 ක්ද විකාශය කරන ලදී. තවද වැඩසටහන් 224 ක් සිංහල හඬකවා ඇති අතර වැඩසටහන් 107 ක් දෙමළ උපසිරැසි සහිතව විකාශනය කර ඇත. එහි නිෂ්පාදන පිරිවැය රු.මි. 40.23 කි.

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් සිදුකල ප්‍රාග්ධන ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය සහ මුළු ඇස්තමේන්තුව (රු.මි.) | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | |
|---|---|---|---|---|
| | ප්‍රගතිය | % | වාර්ෂික ප්‍රතිපාදන | වියදම |
| වැඩසටහන් නිෂ්පාදන පහසුකම් ඉහළ නැංවීම හා යාවත්කාලීන කිරීම (රු.මි. 150) | ඉලෙක්ට්‍රොනික් ක්ෂේත්‍ර නිෂ්පාදන කටයුතු හා ඉලෙක්ට්‍රොනික් ප්‍රවෘත්ති ආවරණ සඳහා තාක්ෂණික වශයෙන් උසස් අධි විස්තෘත Camcorder 10 ක් මිලදී ගැනීම. | 100 | 150 | 16.9 |
| | මැදිරි අංක 1,2,3,4 හා ප්‍රවෘත්ති මැදිරිය සඳහා අවශ්‍ය අධිවිස්තෘත උපකරණ (HD Digital waveform Monitor) 07 ක් මිලදී ගැනීම. | 90 | | 15 |
| | ප්‍රධාන පාලක මැදිරි සඳහා HD NLE Machine 10 ක් මිලදී ගැනීම. | 80 | | 25.5 |
| | ප්‍රධාන පාලක මැදිරිය හා අනෙකුත් මැදිරි සඳහා New Communication System යෙදීම. | 90 | | 15 |
| **එකතුව** | | | **150** | **72.4** |

මීට අමතරව සංහිඳියාවේ නාලිකාව වන නේත්‍රා නාලිකාවේ ප්‍රවර්ධනයට සහ රූපවාහිනී නාලිකාවන්හි ආවරණ කලාපය වැඩිදියුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ පැවති සාකච්ඡා අනුව ලබා ගැනීමට හැකිවිය.

**ආසියා ශාන්තිකර විකාශ සංවර්ධන ආයතනයේ (Asia Pacific Institute for Broadcasting Development - AIBD) 17 වන මහා සමුළුව**

ආසියා ශාන්තිකර කලාපයේ රටවල් තුළ විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව හා කාලීන වශයෙන් මතුවන ගෝලීය, කලාපීය සහ ජාතික ගැටලු සැලකිල්ලට ගෙන කථිකාවතක් ඇති කරමින් කලාපය තුළ දියුණු සහ ශක්තිමත් විද්‍යුත් මාධ්‍ය පරිසරයක් නිර්මාණය කර ගැනීම අරමුණු කරගත් ආසියා ශාන්තිකර විකාශ සංවර්ධන ආයතනයේ 17 වන මහා සමුළුව 2018 අගෝස්තු මස 2 සිට 4 දක්වා කොළඹදී පැවැත්වීය.

**2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**

ජාතික රූපවාහිනියේ වාර්ෂික ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා 2018 අයවැයෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, සංස්ථාවේ පුනරාවර්තන වියදම් පියවා ගැනීමට මසකට රු.මි. 40 බැගින් 2018 වර්ෂය සඳහා රු.මි. 480 ක් ද සංස්ථාවේ තුන් අවුරුදු සැලැස්මේ (2018-2020) අඩංගු තාක්ෂණික ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රාග්ධන වියදම් වශයෙන් පිළිවෙලින් 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා රු.මි. 550 ක් රු.මි. 68 ක් සහ රු.මි. 42 ක් ද වශයෙන් රු.මි. 660 ක් ද මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව 2018 වර්ෂයේ තාක්ෂණික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 160 ක ප්‍රාග්ධන වියදම් වෙන් කර ඇත. ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දී ඇති අක් මුදල් ප්‍රමාණය රු.මි. 100 කි.

| අයිතමය | (රු.මි.) |
|---|---|
| ආදායම | 2058.91 |
| වියදම | (2347.30) |
| ලාභය/ අලාභය | (288.39) |
| භාණ්ඩාගාර පුනරාවර්තන වියදම් ලැබීම | 479.00 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පසු ලාභය/පාඩුව | 190.61 |
| බදු | (1.81) |
| බදු පසු ලාභය/ අලාභය | 188.80 |

**2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති**

2017 ඔක්තෝබර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අනුමත වූ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීම.

- ඉහළ විකාශන තත්වයකින් යුතු ආකර්ශනීය වැඩසටහන් නිෂ්පාදනය,
- ප්‍රධාන පාලක මැදිරිය යාවත්කාලීන කිරීම,
- මැදිරි අංක 03 අධිවිස්තෘත විකාශන කටයුතු සඳහා පරිවර්තනය කිරීම.
- රූපවාහිනී වැඩසටහන් නාලිකාවල භෞමික විකාශන තත්වය ඉහළ නැංවීම.
- පරිගණක ජාලගත කිරීම් හා
- රූපවාහිනී වැඩසටහන් ඩිජිටල් තාක්ෂණයට අනුව සංරක්ෂණය කිරීම.

# සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

**හැඳින්වීම**

1979 දී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මාධ්‍ය ජාලයක් වශයෙන් කටයුතු කරමින් සිටී. සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN) රජය සතු වූ පොදු සමාගමක් ලෙස පවත්වා ගෙන යනු ලබන අතර ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ස්වාධීන රූපවාහිනීය **ITN** හා **වසන්තම් TV** ලෙස රූපවාහිනී නාලිකා දෙකක් ද **ITN FM** හා **වසන්තම් FM** ලෙස ගුවන් විදුලි සේවා දෙකක් ද පවත්වා ගෙන යනු ලැබේ. ගතවූ වසර කිහිපය තුළ ඉතාමත් බලගතු රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය ජාලය බවට ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වර්ධනය වූ අතර, මුළු මහත් ශ්‍රී ලංකාව පුළුල්ව ආවරණය කෙරෙන ඉතා ප්‍රබල විකාශන ශක්තියක් සතු වේ. මුල් අවධියේ සිටම උසස් ප්‍රමිතියකින් යුතු වැඩසටහන් සිය ප්‍රේක්ෂක පිරිස වෙනුවෙන් පෙළගස්වන්නට ස්වාධීන රූපවාහිනිය සමත් වූ අතර ශ්‍රී ලාංකේය සංස්කෘතික, සමාජයීය හා ආගමික සාරධර්ම අනුගමනය කරමින් පවුලේ නාලිකාව ලෙස නමක්, ගරුත්වයක් හා ඉහළ පිළිගැනීමක් ද අත්කර ගෙන ඇත.

**දැක්ම**

"ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියමුවා බවට පත්වීම."

**මෙහෙවර**

ශ්‍රී ලාංකීය වටිනාකම් හා සංස්කෘතිය මත බැඳි පවතින ගුණාත්මක, ආකර්ෂණීය හා මානව හිතවාදී වැඩසටහන් ඉදිරිපත් කිරීම.

**අරමුණු හා උපාය මාර්ග**

- විශිෂ්ට අධ්‍යාපනික, තතු සම්පාදක සහ විනෝදාත්මක වැඩසටහන් ඉදිරිපත් කිරීම.
- වැඩසටහන් නිර්මාණය හා විකාශනය සඳහා අති නවීන තාක්ෂණය යොදා ගැනීම.
- සංවිධානයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගෙන යාම.
- නිර්මාණශීලී, නිපුණ, සුදුසුකම්ලත් මානව සම්පත් සංවර්ධනය.
- දේශීය අන්තර්ගතය පතළ කර ගැනීම හා වැඩසටහන් හුවමාරුව මඟින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රේක්ෂකයින් වෙත සමීප කිරීම.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය**

**ඉංජිනේරු අංශය**

2018 අයවැය යෝජනා අනුව ස්වාධීන රූපවාහිනී සේවයේ වසන්තම් රූපවාහිනී නාලිකාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මි. 30 ක් වෙන් විය. ඒ අනුව යාපනයේ පිහිටි වසන්තම් නාලිකා සම්ප්‍රේෂණාගාර කටයුතු සඳහා අවශ්‍ය 55" KTV ග්‍රාහක 2 ක්, සම්ප්‍රේෂකයක් හා උපාංග මිලදී ගැනීම සඳහා රු.මි. 15 ක් වටිනා ණයවර ලිපි විවෘත කර ඇත. තවද රු.මි. 4.6 ක ශ්‍රව්‍ය හා දෘශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ඇණවුම් කර ඇත. ලැබුනු අක් මුදල් ප්‍රමාණය රු.මි. 10 කි.

ආයතනික අරමුදලින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| | **ව්‍යාපෘතිය සහ මුළු ඇස්තමේන්තුව (රු.මි.)** | **භෞතික ප්‍රගතිය** | | **මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | |
|---|---|---|---|---|---|
| | | **ප්‍රගතිය** | **%** | **වාර්ෂික ප්‍රතිපාදන** | **වියදම** |
| 1. | නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු (රු.මි. 15) | බිත්ති හා බිම අවසන් අදියර. | 50 | 15 | 8.37 |
| 2. | රූපවාහිනී මැදිරි සංකීර්ණය වැඩිදියුණු කිරීම. (රු.මි. 18.5) | උපකරණ මිලදී ගැනීම. | 34 | 18.5 | 6.335 |
| 3. | ප්‍රධාන පාලක මැදිරි වැඩිදියුණු කිරීම (රු.මි. 74) | ප්‍රසම්පාදන කටයුතු සිදුවේ. | 25 | 54 | - |
| 4. | ආයතනයේ විදුලි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සූර්යය කෝෂ සවි කිරීම. (100 kw) (රු.මි. 18.5) | ශක්‍යතා අධ්‍යයනය නිමකර පැනල සවිකිරීම සඳහා වහලය සැකසීම. | 100 | 1.3 | 1.3 |
| 5. | ගුවන්විදුලි විකාශන කටයුතු වැඩිදියුණු කිරීම. (රු.මි. 24) | ITN FM යාපනය විකාශනාගාර සංවර්ධනය. | 23 | 24 | 3.77 |
| 6. | පවතින ප්‍රවෘත්ති මැදිරි වැඩිදියුණු කිරීම. (රු.මි. 21.7) | ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරේ. | 10 | - | - |

- ITN TV හා VTV රූපවාහිනී නාලිකා ආවරණ කලාප වැඩිදියුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග පැවති සාකච්ඡා අනුව ලබා ගැනීමට හැකිවිය.

- විදේශ පුහුණු 8 ක් ද, දේශීය පුහුණු 16 ක් ද, සේවකයින් 676 ක් සඳහා රක්ෂණ ආවරණයක්ද ලබා දෙමින් ආයතනයේ සේවක අභිප්‍රේරණය සඳහා රුපියල් මිලියන 49.44 ක් වැය කර ඇත.

**වැඩසටහන් අංශය**

සමාජමය වගකීමක් හා වගවීමක් සහිත වැඩසටහන් රාශියක් 2018 වසර තුළ පෙළගස්වා ඇති අතර සහජීවනය සහ සංහිඳියාව බහුතරයක් වැඩසටහන්වල අන්තර්ග්‍රහණයවී ඇත. තරඟකාරී මාධ්‍ය වාර්තාකරණයක් තුළ ප්‍රේක්ෂක ප්‍රජාවගේ රසඥතාවය පෝෂණය කිරීමට සුදුසු මට්ටමේ සාරධර්ම සුරක්ෂිත කරන අන්තර්ගත ඇතුළත් වැඩසටහන් ඉදිරිපත් කරන නාලිකාවක් වශයෙන් ITN වැඩසටහන් අංශය 2018 වසරේ පෙරමුණ ගෙන සිටීමට සමත් විය.

සමබර පුවත් විකාශයට හා රජය විසින් සිදුකරන සංවර්ධන වැඩසටහන් සඳහා විශේෂ කාලයක් වෙන් කිරීමට ස්වාධීන රූපවාහිනී සේවය කටයුතු කරන ලදී.

**විශේෂිත වැඩසටහන්**

- 2016 වර්ෂයේ ආරම්භ කරන ලද "Youth With Talent" වැඩසටහන ජනප්‍රියතාවය නිසාම 2018 වර්ෂය තුළදී ද ජාතික තරුණ සේවා සභාවේ දායකත්වයෙන් විකාශය කෙරිණ. පුද්ගලයන්ගේ සැඟව ඇති අසමසම කුසලතා විචිත්‍රවත්ව ඉදිරිපත් කිරීමට මෙම වැඩසටහන ඉවහල් විය. ලංකාවේ වැඩිම ප්‍රේක්ෂක පිරිසකගේ ඇගයීමට ලක් වූ මෙම වැඩසටහන තාරුණ්‍යයේ ජනප්‍රියම වැඩසටහන ලෙසද පිදුම් ලැබූ අතර මෙම වර්ෂයේ වැඩිම ආදායමක් ලැබූ වැඩසටහන ද වේ. (වියදම රු.මි. 64)
- "ගමට කෝටියක්" වැඩසටහන ග්‍රාමීය තරුණ ප්‍රජාව විසින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ඔවුන්ගේ දායකත්වයෙන් සාර්ථකව ඉදිරිපත් කරන ලදී. (වියදම රු.මි. 0.013)
- "සමාජ ව්‍යවසායකයන්ගේ ජය බිම" යන තේමාව යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අත්වැලක් වීම අරමුණු කොට ආරම්භ කරන ලද "ඇත් පවුර" වැඩසටහන සාර්ථක දේශීය ව්‍යවසායකයින්ගේ හා විද්වතුන්ගේ උපදෙස් හා මූල්‍යමය දායකත්වයෙන් පළමු අදියර හා දෙවන අදියර ක්‍රියාත්මක කරන ලදී. (වියදම රු.මි. 29.6)
- නව්‍ය හා ප්‍රාසාංගික කලාකරුවන් පිළිබඳ දැනුවත් කිරීම හා එකී කලාව ජන හදවත් තුළට ප්‍රක්ෂේපණය කිරීම සඳහා "සොඳුරු අඥාව" වැඩසටහනද, කලාකරුවන් පිළිබඳ අතීත සැමරුම් හා ඔවුන්ගේ අත්දැකීම් සමඟ මාධ්‍ය ක්ෂේත්‍රයට වූ දායකත්වය ඇගයීම උදෙසා "ශනිදා සාදය" වැඩසටහන ද ජගත් හා දේශීය සිනමාව අලලා "සිනෙරු" නම් වැඩසටහනද, සංගීතය ප්‍රියකරන ප්‍රේක්ෂකයන් ඉලක්ක කර ගත් "Chat & Music" හා "නොමියන සිහිනය" වැඩසටහනද, (වියදම රු.මි. 28.0) අකුරු කියවීමේ රුචිය පෝෂණය කිරීම සඳහා "අකුර" වැඩසටහනද, ආර්ථික, සාමාජීය හා සාහිත්‍ය ආදී අංශවලින් දායකත්වයක් දක්වන ආයතන හා පුද්ගලයන්ගේ සේවා ඇගයීම් වස් විවෘත වූ "සිවුමංසල" හා "Coffee Table" යනාදී වැඩසටහන්ද හඳුන්වාදී ඇත.
- ආර්ථික, සමාජීය හා දේශපාලනික ක්ෂේත්‍රයේ විවාදාත්මක විෂයන්, විද්වත් මඬුල්ලකගේ සහභාගීත්වයෙන් "සංවාදය" හා "තීරණය" නම් කාලීන සංවාදාත්මක වැඩසටහන්ද ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් විකාශය කෙරිණි.
- කාලීන විෂයන්, ජාතික නිදහස් දිනය, ලෝක කාන්තා දිනය, නත්තල, හින්දු හා මුස්ලිම් ආගමික උත්සවවලට සමගාමීව විවිධ වැඩසටහන් විකාශය කරන ලදී. (වියදම රු.මි. 12.2)
- පහ වසර ශිෂ්‍යත්වය, සමාන්‍ය පෙළ හා උසස් පෙළ ඉලක්ක කර ගත් "තක්ෂිලාව" වැඩසටහන් මාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය වැඩසටහන් ලෙස ප්‍රමුඛතාව ලබා දීමට හැකි විය. (වියදම රු.මි. 0.4)
- පාසල් සිසුන් අතර මාධ්‍ය විෂය දැනුම වැඩිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය සමඟ එකතුව "මාධ්‍ය ප්‍රදීප" සම්මන්ත්‍රණ සතිපතා පැවැත්වීමට කටයුතු කරන ලදී. (වියදම රු.මි. 6.4)

**2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**

වසන්තම් රූපවාහිනී නාලිකාව ප්‍රවර්ධනය සඳහා රු.මි. 304 ක ප්‍රතිපාදන 2018 අයවැයෙන් ලබා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. 2018 අයවැය යෝජනාවක් ලෙස ඉදිරිපත් වූ මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වශයෙන් රු.මි. 30 ක් පමණක් ලැබුණි.

**නාලිකා අනුව ලාභ/අලාභ - 2018.12.31 දිනට**

| **නාලිකාව** | **ආදායම (රු.මි.)** | **ලාභය / අලාභ (රු.මි.)** |
|---|---:|---:|
| ITN | 948.8 | (546.9) |
| වසන්තම් TV | 130.6 | (40.5) |
| ITN FM | 74.1 | (47.4) |
| වසන්තම් FM | 42.0 | (8.3) |
| Prime TV | - | - |
| Prime Radio | - | - |
| **එකතුව** | **1195.5** | **(643.1)** |

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31 දිනට**

| **අයිතමය** | **(රු.මි.)** |
|---|---:|
| ආදායම | 1376.47 |
| වියදම | (1998.93) |
| ලාභය/ අලාභය | (622.46) |
| බදු | (5.14) |
| වෙනත් විස්තීරණ ආදායම | (2.43) |
| බදු පසු ලාභය/ අලාභය | (630.03) |

**2019 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතින් හා වැඩසටහන්**

- 2019 වසර අවසාන වන විට අංක 01 නාලිකාව බවට පත්වීම.
- 2018 වසරේ ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව 2019 වසරේ ආදායම 75% කින් ඉහළ නැංවීම.
- 2018 වසරේ සත්‍ය වියදමට සාපේක්ෂව 2019 වසරේ පොදුකාර්යය හා අනවශ්‍ය වියදම් 25% කින් අවම කිරීම.
- රජයේ නාලිකාවක් ලෙස ඉතා පුළුල්ව රජයේ වැඩපිලිවෙළ හා ජාතික තොරතුරු සියලු භාෂා කතා කරන ජනතාව වෙත ගෙන යාම හා සංහිඳියාව වර්ධනය කිරීම සඳහා ගුණාත්මකභාවයෙන් යුතු නිවැරදි යාන්ත්‍රණයක් සැකසීමට ඉවහල් වන වසන්තම් ටීවී නාලිකාවේ ආවරණ කලාපය වැඩිදියුණු කිරීම.
- රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය සංස්කෘතික විවිධත්වය අනන්‍යතාවය හා පැවැත්ම මෙන්ම පාරිසරික සුරක්ෂිතතාව හා ප්‍රවර්ධනය උදෙසා වූ ගුණාත්මක හා නිර්මාණශීලී වැඩසටහන් පෙළගැස්මක් 2019 වසර පුරාම ඉදිරිපත් කිරීම.
- ජාත්‍යන්තර මෙන්ම ජාතික මටටමේ තරඟකාරීත්වයට මුහුණ දිය හැකි දැනුම ආකල්ප හා කුසලතාවයෙන් යුතු නිපුණ හා විනයගරුක වූත් වෘත්තීයමය වූත් මානව සම්පතක් ආයතනය තුළ ගොඩනැගීම.
- මහජන හිතකාමී යහපත් මාධ්‍ය සංස්කෘතියක් රට තුළ නිර්මාණය කිරීම උදෙසා වූ ආදර්ශමත් රාජ්‍ය මාධ්‍ය ආයතනය ලෙස කටයුතු කිරීම.

# සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

**හැඳින්වීම**

"ලේක්හවුස්" නමින් ප්‍රචලිත සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1926 දී ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද රජය සතු සීමිත සමාගමකි. 1973 අංක 28 දරණ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (විශේෂ විධිවිධාන) පනත අනුව එහි 88% ක හිමිකාරීත්වය රජය වෙනුවෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් දරයි.

වර්තමානයේ ලේක් හවුස් ආයතනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතන අතර පුරෝගාමී මාධ්‍ය ආයතනය බවට පත්ව ඇත. නව පරපුරේ අවශ්‍යතා හඳුනාගනිමින් ලේක්හවුස් ආයතනය විසින් තම ප්‍රධානතම පුවත්පත් එනම් **සිළුමිණ, දිනමිණ, සන්ඩේ ඔබ්සර්වර්, ඩේලිනිව්ස්, තිනකරන්** සහ **වාරමංජරී** යන පුවත්පත්වල විද්‍යුත් කලාපයන් අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාල හරහා එළිදක්වනු ලැබේ. සියළු පාඨක කණ්ඩායම් ඉලක්ක කරගනිමින් ලේක් හවුස් ආයතනය විසින් ප්‍රකාශයට පත්කරන පුවත්පත් අතර කාන්තාවන් වෙනුවෙන් "**තරුණී**", දරුවන් වෙනුවෙන් "**මිහිර**", බෞද්ධ ජනතාව වෙනුවෙන් " **බුදු සරණ**", සිනමා තොරතුරු ප්‍රියකරන පාඨකයන් උදෙසා "**සරසවිය**", ජෝතිෂ්‍යය විෂය සඳහා ඇල්මක් දක්වන පාඨකයන් සඳහා "**සුබසෙත**", වෛද්‍ය තොරතුරු සඳහා "**ආරෝග්‍යා**", අධ්‍යාපනික අතිරේක ලෙස " **අතුරු මිතුරු**", සහ අධිකරණ තොරතුරු පළ කරන "**මාංචු**" යන පුවත්පත් සහ පුවත් අතිරේක ප්‍රධාන වේ.

අන්තර්ජාලය ජංගම දුරකථන තුළට පිවිසීමත් සමග දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල ජංගම මෘදුකාංගයන් එළිදැක්වීමටද කටයුතු කර ඇති අතර අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාල තුළ ලේක්හවුස් වෙබ් පිටුව පරිහරණය කරන්නන්ට වැඩි විනෝදාස්වාදයක් ලබා දෙන අයුරින් පුවත් විකාශය කිරීම සඳහා නව ශබ්දාගාරයක් ද හඳුන්වාදී ඇත. ශත වර්ෂයකට ආසන්න සිය ගමන් මග තුළ මාධ්‍ය කර්මාන්තයේ පෙරලිකරු ලෙස තම ස්ථානය තහවුරු කර ගැනීමට ලේක්හවුස් ආයතනය සමත්ව ඇත. ජාතික ආයතනයක් වශයෙන් මාධ්‍ය කාර්මාන්තයේ මෙන්ම ජාතියේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම හා එම අරමුණු මත පදනම්ව ආයතනයේ අඛණ්ඩ වර්ධනයක් ළඟාකර ගැනීම ලෙක්හවුස් ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයයි.

**දැක්ම**

"අනෙකුත් මාධ්‍ය සේවා ශක්‍යතාවයන්ද සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මාධ්‍ය ආයතනය ලෙස රැඳී සිටීම".

**මෙහෙවර**

ඒකරාශී කිරීම ප්‍රධාන ධාවන කාරකය වශයෙන් ගෙන, පුරෝගාමී මුද්‍රිත මාධ්‍ය ආයතනය දිවයිනේ වැඩිම ඉල්ලුමක් සහිත විශ්වාසනීය හා උසස් තත්වයේ මාධ්‍ය නිෂ්පාදන / සේවා සපයන්නා බවට පත් කිරීම.

මෙහෙයුම් විශිෂ්ඨත්වය සහ වෙළඳනාම වටිනාකම උපක්‍රමිකව යොදා ගනිමින් පුළුල් ප්‍රවෘත්ති රැස් කිරීමේ හා අලෙවිකරණ යටිතළ පහසුකම් නවීනතම තාක්ෂණය හා මුසු කරමින් මෙය සාක්ෂාත් කර ගන්නෙමු.

අපගේ ගනුදෙනුවලදී ජාතික අභිලාෂය ඉහළින්ම තබා ගනිමින් අපගේ වෙළඳපල නායකත්වය ඉදිරියට ගෙනයාම සහ ලාභදායීත්වය හා වර්ධනය පවත්වාගෙන යාමට පැහැදිලිව අර්ථ දක්වන ලද උපාය මාර්ග අප නිරන්තරයෙන්ම අනුගමනය කරමු.

**අරමුණු**

- පුවත්පත් කර්මාන්තයේ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.
- නිවැරදි සහ විශ්වාසනීය තොරතුරු සැපයීම.
- වඩාත්ම කාර්යක්ෂම පුවත්පත් සේවා සැපයුම් සහ ප්‍රවාහකයා බවට පත්වීම.
- පාරිභෝගික සේවාවේ විශිෂ්ඨත්වය.
- කර්තෘ මණ්ඩල පරිපාලන තොරතුරු තාක්ෂණ පද්ධතියක් හඳුන්වාදීම සහ ජනමාධ්‍ය සහ ග්‍රැෆික් නිර්මාණ පුහුණු කිරීමට ඇතුළත් කිරීම.
- ලේක් හවුස් ගොඩනැගිල්ලේ ගාම්භීරත්වය යලි ඇති කිරීම සහ එම මෙහෙයුම් කටයුතු සඳහා කාර්යක්ෂම සහයක සේවා ලබාදීම.
- කාලීන ප්‍රවණතා සහ ඉල්ලුම් පාදක කොට ගෙන වෙළඳපල කොටස් කිරීම හා සන්නාම ස්ථානගත කිරීම.
- මුද්‍රිත මාධ්‍ය දැන්වීම් කලාවේ වෙළඳපල ප්‍රමුඛත්වය ශක්තිමත් කිරීම.
- මුල්‍ය දෙපාර්තමේන්තුව
  i මනා මුල්‍ය තත්වයක් පවත්වා ගැනීම.
  ii මුදල් කළමනාකරණයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම.
  iii බොල් ණය අවම කිරීම.
  iv තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.
- නව මාධ්‍යයන්ගේ වඩාත්ම ක්‍රියාකාරී ප්‍රකාශන බවට පත්වීම.
- අභිසාරී සමාජයීය මාධ්‍යයන්ට ඇතුළත් වීම.
- මානව සම්පත් ප්‍රතිපත්තිය සහ පරිචයන් වැඩිදියුණු කිරීම.
- සේවකයන්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම.
- සැපයුම් දාම අංශය - ප්‍රසම්පාදයකයන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ සියළු ප්‍රසම්පාදනයන් පටිපාටිවලට අනුකුල වන බවට වගබලා ගැනීම.
- අරමුදල් කළමනාකරණ දෙපාර්තමේන්තු - කාර්යක්ෂමතාව සහ ඵලදායී ලෙස සේවාවන් ලබා ගැනීම.
- පුවත්පත් වෙබ් මුද්‍රණයේ විශිෂ්ඨත්වය කරා ළඟා වීම.
- ගබඩා අංශය ද්‍රව්‍ය කළමනාකරණයේ ඵලදායීතාව වැඩිදියුණු කිරීම.

2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

**01. කර්තෘ මණ්ඩල ප්‍රගතිය**

- LMRB ඇගයීම : බහුතරයක් කියවනු ලබන ඉංග්‍රීසි දෛනික පුවත්පත ලෙස "Daily News" පුවත්පත ද බහුතරයක් කියවනු ලබන ඉංග්‍රීසි සතිපතා පුවත්පත ලෙස "Sunday Observer" පුවත්පත ද වැඩිදියුණු වූ සිංහල පුවත්පත ලෙස "දිනමිණ" පුවත්පත ද නම් කෙරුණි.
- "Daily News" පුවත්පතට වසර සියයක් සැපිරීම නිමිත්තෙන් පිටු 128කින් මුද්‍රණය කර නිකුත් කිරීම.
- "රැස" නමින් දෛනික සිංහල පුවත්පතක් හා "සත්මඬල" නමින් මාසික සඟරාවක් ආරම්භ කිරීම.
- "ආරෝග්‍යා", "අතුරු මිතුරු" නැවත දියත් කිරීම.
- සිළුමිණ සමග නිකුත්කල "ක්‍රීඩා" සඟරාව වෙනුවට "රන්බිම" නව සඟරාව නිකුත් කිරීම.
- Bestweb.lk සම්මාන :

  www.dinamin.lk , හොඳම ක්‍රීඩා හා විනෝදාශ්වාද වෙබ් අඩවිය ලෙසද, www.thinakaran.lk හොඳම දමිළ වෙබ් අඩවිය ලෙස ද, www.dinamin.lk , www.dailynews.lk, www.thinakaran.lk , සඳහා හොඳම පුවත් වෙබ් අඩවි ලෙස ද මාධ්‍යවේදී විශිෂ්ඨතා සම්මාන උළෙලේදී (Journalism Excellence Awards) ඇගයීමට ලක් විය.
- පුස්තකාලය ඩිජිටල්කරණ කිරීම ආරම්භ කිරීම.
- පුවත්පත් මෙන්ම ආයතනය මගින් ප්‍රකාශය කරනු ලබන සඟරා නව මාධ්‍ය ඔස්සේ ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ලෙස ශ්‍රවණයට හා දැකගැනීමට සැලැස්වීම.

**02. ප්‍රචාරක හා ප්‍රවර්ධන මෙහෙයුම් ඉහළ නැංවීම.**

- "ගම් නගර චාරිකා" වැඩසටහන් පුළුල් කිරීම.

  අම්පාර, ගාල්ල යන දිස්ත්‍රික්කවල වැඩසටහන් පැවැත්වීමට ඉලක්ක කළ ද ගාල්ල දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන නොපැවැත්විනි.
- පුවත්පත් ප්‍රවර්ධනය සඳහා බස් රථ, ප්‍රදර්ශන පුවරු හා නව දැන්වීම් ක්‍රමවේද භාවිතා කිරීම.
- පුවත්පත් සංසරණය වැඩි කිරීම සඳහා නව නියෝජිතයින් පත් කිරීම.
- පුවත්පත් නියෝජිතයින් සඳහා වන සම්මාන රාත්‍රිය (News Agents' Awards Night) සංවිධානය කිරීම.
- Observer School Boy Cricketer 2018 යන ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- "සරසවි චිත්‍රපට උළෙල" 2018 අගෝස්තු 03 දින පැවැත්වුනි.

**03. කර්තෘ මණ්ඩල සේවකයන් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.**

- කර්තෘ මණ්ඩල සේවකයන්ගේ පහසුකම් ඉහළ නැංවීම.
- සේවක පුහුණු වැඩසටහන් දියත් කිරීම
  - උප කතෘකරණය පිළිබඳ පාඨමාලාව - අවුරුදු 01
  - ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳ පාඨමාලාව - මාස 06
  - ප්‍රවෘත්ති ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලාව - මාස 03
  - සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨමාලා - මාස 09

**04. දැන්වීම් වලින් උපයන ආදායම 10% යේ සිට 15% දක්වා ඉහළ නැංවීම.**

- ආයතනයට ලාභදායි ගණුදෙනුකරුවන්/ සේවාදායකයන් හඳුනා ගැනීම. එම හඳුනාගත් කොට්ඨාශය සඳහා අගය එකතු කිරීම් (Value Addition) ප්‍රදානය කිරීම, නව ප්‍රාදේශීය දැන්වීම් නියෝජිතයන් පත් කිරීම.
- Daily News පුවත්පත සමඟ කාලීනව වැදගත් මාතෘකාවක් පිළිබඳව ලිපි හා දැන්වීම් අඩංගු සඟරාවක් නිකුත් කිරීම.

**05. අනුග්‍රාහකත්වයන් ප්‍රවර්ධනය කිරීම.**

- සියලු ප්‍රකාශනයන්හි අනුග්‍රාහකත්වයන් සඳහා විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම.
- කාලීන තොරතුරු සම්බන්ධයෙන් පාඨකයින් දැනුවත් කිරීමට නොමිලයේ පිටපත් බෙදාහැරිම.
- සමස්ථ දිස්ත්‍රික්කයන්ම නියෝජනය වන පරිදි පුවත්පත් නියෝජිතයන් (News Agents) හා වාර්තාකරුවන් (Correspondents) සඳහා මාසිකව රැස්වීම් පැවැත්වීම. බස්නාහිර, මධ්‍යම, සබරගමුව හා උතුරු මැද යන පළාත් ආවරණය කර ඇත.
- තොරතුරු තාක්ෂණය පදනම් කරගත් අලෙවි ක්‍රියාවලි ප්‍රවාහයක් (Sale Process Flow) හඳුන්වාදීම.

**06. තොරතුරු තාක්ෂණය හා මෙහෙයුම් සඳහා වන පහසුකම් වැඩිදියුණු කිරීම.**

- Magnum මුද්‍රණාලය සඳහා අමතර මුද්‍රණ ඒකක 2 ක් ලබා ගැනීමට කටයුතු කිරීම.

**07. මූල්‍ය අංශය සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් හා නවීකරණ කටයුතු හඳුන්වා දීම.**

- මූල්‍ය හා රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වන මෘදුකාංගය වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුවෙමින් පවති. මේ සඳහා රු.මි. 10 ක් වැය කර ඇත.

**08. නවීන පහසුකම් වලින් සමන්විත වන පරිදි ආයතනයේ අභ්‍යන්තරික ගෘහ අලංකරණය වැඩිදියුණු කිරීම.**

- ලේක් හවුස් ගොඩනැගිල්ලේ අභ්‍යන්තරය වැඩිදියුණු කිරීම සඳහා රු.මි. 10 ක් ඇස්තමේන්තු කර ඇති අතර තෝරාගත් දෙපාර්තමේන්තු කිහිපයක නව සැලසුම් නිම කිරීම සඳහා රු.මි. 05 ක් වැය කර ඇත.

**09. මානව ප්‍රාග්ධනය (Human Capital) ප්‍රවර්ධනය කිරීම.**

- මානව සම්පත් කාර්යය ප්‍රවාහය (Work Force Flow) දියුණු කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- මානව සම්පත් තොරතුරු පද්ධතිය (උදා: වැටුප් සැකසීමේ ක්‍රියාවලිය -Payroll) වැඩිදියුණු කිරීමේ කටයුතු නිම කර ඇත.
- ආයතනයේ ආදී සේවකයින් (Annual Alumni Communique) ඉලක්ක කර ගෙන "සංදේශය" ප්‍රකාශන 04 ක් එළිදක්වා ඇත.

**10. නව හඳුන්වාදීම්**

ඩේලි නිවුස්, දිනමිණ, තිනකරන් යන ප්‍රවේශයන් (Apps) සඳහා කඩින් කඩ පුවත් සහ යාවත්කාලීන කිරීම් හඳුන්වා දීම, Adpro ප්‍රවර්ධනය, www.lakehouse.lk වෙබ් අඩවිය නැවත දියත් කිරීම, Liberty මුද්‍රණාංගය දියුණු කිරීම, HRIS පද්ධතිය හඳුන්වාදීම, වාහන සංචිතය GPS පද්ධතියට සම්බන්ධ කිරීම සහ නව ආයතනික හැඳුනුම්පතක් හඳුන්වා දීම සිදුකර ඇත.

**11. සේවක අභිප්‍රේරණය**

ලේක් හවුස් මාධ්‍යවේදීන්ගේ කුසලතා අගයනු වස් මාසිකව "රන් සලකුණ" සම්මාන ලබා දීම.

**13. වෙනත්**

- 2018 ක්‍රියාකාරී සැලැස්ම සහ 2018 - 2020 උපාය මාර්ගික සැලැස්ම සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- ආයතනයේ සියළුම දෙපාර්තමේන්තු සඳහා ප්‍රධාන කාර්යය සාධන දර්ශක (KPI – Key Performance Indicators) හඳුන්වාදීම හා ඒ අනුව ක්‍රියාත්මක වීම.

**2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**

| අයිතමය | (රු.මි.) |
|---|---|
| ආදායම | 3085.62 |
| වියදම | (3247.32) |
| ලාභය/අලාභය | (161.69) |
| බදු | 13.33 |
| ගැලපුම් | 20.14 |
| බදු පසු ලාභය/ අලාභය | (128.22) |

# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

**හැඳින්වීම**

1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මෙම අමාත්‍යාංශය යටතේ කටයුතු කරන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

පුවත්පත් නිදහස ආරක්ෂා කරගැනීම මෙම මණ්ඩලයේ ප්‍රමුඛ අරමුණ වන අතර, එම නිදහස අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීම, පුවත්පත්වල අන්තර්ගතයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම, මහජනයා සතු සත්‍ය කරුණු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම යන අරමුණුද අවශේෂ අනෙකුත් අරමුණු අතර වැදගත් වේ.

පුවත්පත් වාර්තාවල පළවන ඇතැම් විවාදාත්මක කරුණු සම්බන්ධයෙන් ආචාරධර්මානුකූලව මාධ්‍යවේදීන් හැඩ ගන්වමින් යම් නෛතික ප්‍රවේශ ඔස්සේ මාධ්‍යවේදීන් සඳහා මඟපෙන්වීමේ කටයුතු මෙන්ම, මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඔවුන්ගේ වෘත්තීමය තත්වය ඉහළ දැමීමටත් විශේෂ අවධානයක් යොමු කර ඇත.

පුවත්පත් විධිමත් කිරීම, පුවත්පත් නිෂ්පාදනයෙහි හෝ පළ කිරීමෙහි නියුක්ත සියලු අංශ අතර ක්‍රියා කිරීමේ නිසි සම්බන්ධතාවයකට අනුබල දීම, පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, පත්‍ර කලාවේදී වෘත්තියට බඳවා ගැනීමේ ක්‍රම, සුඛසාධනය අධ්‍යාපනය හා පුහුණු කිරීම් වැඩිදියුණු කිරීම හා පුවත්පත් පවත්වාගෙන යාමට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුවද කටයුතු කිරීම පුවත්පත් මණ්ඩලය සතු කාර්යභාරය වේ.

**පුවත්පත් මණ්ඩලය පිහිටුවීමේ පරමාර්ථ**

- ශ්‍රී ලංකාවේ පුවත්පත්වලට අදාළ කරුණු විධිමත් කිරීම.
- ඒ කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීම.
- ඇතැම් කරුණු පුවත්පත් වල මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට අදාළ වැරදි විමර්ශනය කිරීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම.

**පුවත්පත් මණ්ඩලයේ අරමුණු**

- ශ්‍රී ලංකාවේ පුවත්පත් නිදහස සුරක්ෂිත කිරීම එම නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම වැළැක්වීම හා සම්මත උසස් ම වෘත්තීය තත්ත්වයකට අනුකූල ව ශ්‍රී ලංකාවෙහි පුවත්පත්වල ස්වරූපය ආරක්ෂා කිරීම.
- කරුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශ ප්‍රවෘත්ති ලෙස පුවත්පත්වල පළ කිරීමේ සහ කරුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශ පදනම් කරගත් අදහස් පුවත්පත්වල පළ කිරීමේ නිදහස සුරක්ෂිත කිරීම.
- පුවත්පත් හා පත්‍ර කලාවේදීන් විසින් උසස් පත්‍ර කලාවේදී ආචාරධර්ම පවත්වාගෙන යනු ලැබීම ගැන වග බලා ගැනීම හා පුරවැසි අයිතිවාසිකම් හා වගකීම් යන කරුණු දෙක පිළිබඳ නිසි හැඟීමක් දනවීම.

- පත්‍ර කලාවේදී වෘත්තියෙහි සේවයට බඳවා ගැනීමේ ක්‍රම, සුබසාධනය, අධ්‍යාපනය හා පුහුණු කිරීම් වැඩිදියුණු කිරීම.
- පුවත්පත් නිෂ්පාදනයෙහි හෝ පළ කිරීමෙහි නියුක්ත සියලු අංශ අතර ක්‍රියා කිරීමේ නිසි සම්බන්ධතාවකට අනුබල දීම හා ප්‍රවෘත්ති සැපයීම හා පතුරුවා හැරීම සඳහා අවශ්‍ය බව කලින් කල පෙනී යා හැකි පොදු සේවාවන් ඇති කිරීම.
- පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, පොදු යහපත සඳහා වූ හා පොදු වැදගත්කමින් යුත් තොරතුරු සැපයීම සීමා වීමට හේතු විය හැකි අලුත් තත්ත්වයන් හා ශ්‍රී ලංකාවේ පුවත්පත්වල ඇති වන එක් තැන් වීම හෝ ඒකාධිකාරී බවට පත් වීම කෙරෙහි නැඹුරු විය හැකි අලුත් තත්ත්වයන් සමාලෝචනයට භාජන ව තැබීම හා ඒවා සම්බන්ධයෙන් ප්‍රතිකර්ම වශයෙන් සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීම.
- පුවත්පත් විධිමත් කිරීම හා පුවත්පත් පවත්වා ගෙන යාමට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුවද රජයට අනුශාසනා කිරීම.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

**පුවත්පත්වලට එරෙහිව ලැබෙන පැමිණිලි විභාග කිරීම**

ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කරනු ලබන කවර හෝ පුවත්පතක යම් පුද්ගලයකු, සංවිධානයක් හෝ ආයතනයක් පීඩාවට පත් කරන අකාරයේ පුවතක් පළවී ඇත්නම් ඒ සඳහා මණ්ඩලයට පැමිණිලි කළ හැකි අතර අදාළ පැමිණිල්ල ලද පසු එය විමර්ශනය කර දෙපාර්ශවය ගෙන්වා පැමිණිලි විභාග කර පුවත්පත් මණ්ඩලය, පනතට අනුව කටයුතු කරනු ලැබේ.

2018 වසර තුළ විභාග කිරීමට ඉලක්ක කර ගත් පැමිණිලි සංඛ්‍යාව 125 කි. 2017 වර්ෂයෙන් ඉදිරියට පැමිණි පැමිණිලි 35 ක් ද 2018 වර්ෂයේ ලැබුණු පැමිණිලි 51 ක් ද වශයෙන් පැමිණිලි 86 ක් විභාග කිරීම සඳහා ලැබී ඇත. පැමිණිලි විභාග කිරීමේ කටයුතු සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

| පැමිණිලි විභාග කල ආකාරය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| විභාග වෙමින් පවතින | 64 |
| එකඟතාවයට පත් වූ | 11 |
| නිෂ්ප්‍රභ කිරීම | 03 |
| නියෝග නිකුත් කිරීම | 03 |
| ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ | 05 |
| **එකතුව** | **86** |

**පුවත්පත් ලියාපදිංචි කිරීම**

මෙරට තුළ පළ කරන සියළුම පුවත්පත් හා සඟරා මෙම මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු අතර, එමඟින් පුවත්පතේ හිමිකරුවන්ට හා ප්‍රකාශකයින්ට නීත්‍යානුකූල හිමිකමක් ලැබෙනු ඇත.
2018 වසරේ පුවත්පත් ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය පහත දක්වා ඇත.

| **කාලය අනුව පුවත්පත් වර්ගීකරණය** | **ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව** |
|---|---|
| දිනපතා | 10 |
| සතිපතා | 26 |
| මාසික | 54 |
| වෙනත් | 28 |
| **එකතුව** | **118** |

| **භාෂාව අනුව පුවත්පත් වර්ගීකරණය** | **ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව** |
|---|---|
| සිංහල | 69 |
| දෙමළ | 17 |
| ඉංග්‍රීසි | 21 |
| ද්වි/ත්‍රෛභාෂා | 11 |
| **එකතුව** | **118** |

**පුවත්පත් කලාව හා සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

මාධ්‍යවේදීන්ගේ න්‍යායික දැනුම, අවබෝධය සහ කුසලතා දියුණු කිරීම අරමුණු කොට වෘත්තීය මාධ්‍යවේදීන් හා ආධුනික මාධ්‍යවේදීන් සඳහා එක් අවුරුදු පාඨමාලාවක් ලෙස මෙම පාඨමාලාව පවත්වනු ලබන අතර යුනෙස්කෝ සංවිධානය මඟින් හඳුන්වා දෙන ලද පුවත්පත් කලා පුහුණුව පිළිබඳ ලේඛනය පදනම් කරගෙන මෙහි විෂය නිර්දේශය සකසා ඇත.

2018 හත්වන කණ්ඩායමේ අධ්‍යයන කටයුතු සඳහා සිසුන් 48 ක් ලියාපදිංචි වී ඇති අතර 2018-11-30 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී හයවන කණ්ඩායමේ සිසුන් 28 ක් ඩිප්ලෝමා සහතික පත්‍ර ලබාගන්නා ලදී. ඉන්දියාව, නේපාලය, බංගලාදේශය සහ මාලදිවයින යන රටවල පුවත්පත් මණ්ඩල සභාපතිවරු ඇතුළු නිලධාරීන් මෙම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සහභාගී විය.



හයවන කණ්ඩායමේ ඩිප්ලෝමාධාරීන්

**ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙනුවෙන් වැඩමුළු පැවැත්වීම**

ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ න්‍යායික හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමේ අරමුණින් කාලීන හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් මාතෘකා තෝරා ගෙන දිස්ත්‍රික් මට්ටමින් වැඩමුළු හා සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. ඒ අනුව මුළු දිවයිනම ආවරණය වන පරිදි වැඩමුළු 04 ක් පවත්වා ඇත.

"ජාතික සංහිඳියාව මෙරට තුළ ස්ථාපිත කිරීම සඳහා ජනමාධ්‍යවේදියා සතු කාර්යයභාරය" මැයෙන් 2018.03.24 දින හම්බන්තොට හා 2018.05.18 දින කොළඹ යන දිස්ත්‍රික්කවල වැඩමුළු පවත්වා ඇත. "සමාජ මාධ්‍ය හා එහි බලපෑම" මැයෙන් 2018.08.14 දින කළුතර දිස්ත්‍රික්කයේ වැඩමුළුවක් පවත්වා ඇත. "මාධ්‍ය ආචාරධර්ම හා ජනමාධ්‍යවේදියා සතු කාර්යයභාරය" මැයෙන් මාධ්‍ය අධ්‍යයන ගුරුවරුන් හා මාධ්‍යවේදීන් යන දෙපාර්ශවයම ආවරණය වන පරිදි එකවර වැඩමුළු 2018.09.15 දින පොළොන්නරුවේදී පවත්වා ඇත.



මාධ්‍යවේදී වැඩමුළුව - කොළඹ





මාධ්‍යවේදී වැඩමුළුව - හම්බන්තොට

**පාසල් මාධ්‍ය වැඩමුළු පැවැත්වීම**

අ.පො.ස (උ/පෙළ) හා අ.පො.ස. (සා/පෙළ) ට නිර්දේශිත සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන විෂය සම්බන්ධ වැඩමුළු හා සම්මන්ත්‍රණ පවත්වනු ලබන අතර අගනුවරින් බැහැර ප්‍රදේශවල පාසල්වෙත ගොස් සිසුන්ගේ විෂය දැනුම හා අවබෝධය පුළුල් වන ආකාරයට දේශන හා සාකච්ඡා පවත්වනු ලැබේ. 2018 වර්ෂය තුළ පැවැත්වූ පාසැල් වැඩමුළු සංඛ්‍යාව 05 කි.

- "මාධ්‍ය සාක්ෂරතාව හා රස වින්දනය" වැඩසටහන 2018-02-23 දින ඉංගිරිය ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේදීද, 2018-05-23 දින කැළණිය මහාමායා විද්‍යාලයේදීද, 2018-09-13 දින බලපිටිය සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලයේදීද පවත්වන ලදී.
- කුමාරතුංග මුනිදාස ශූරීන් හා කරුණාදාස සූරියආරච්චි ශූරීන් අනුස්මරණය කරමින් පැවති වැඩසටහන 2018-03-05 දින ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේදී පවත්වන ලදී.

වැඩමුළු පැවැත්වීමට අමතරව පාසැල් මාධ්‍ය සංගම් ලියාපදිංචි කිරීම සහ පාසැල් සඳහා ප්‍රකාශන කට්ටල් ලබාදීම ද සිදුකර ඇත.

**විශ්වවිද්‍යාල වැඩමුළු**

රජරට විශ්ව විද්‍යාලයේ දී "සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන" මැයෙන් වැඩමුළුවක් පවත්වන ලදී.

**කාලීන තේමාවන් යටතේ පර්යේෂණ සිදුකිරීම**

පුවත්පත් කලාව සහ ජනමාධ්‍ය විෂය අලලා කාලීන වශයෙන් වැදගත් වේ යැයි හැඟෙන එමෙන්ම සමාජ හා සංස්කෘතික වශයෙන් බලපෑම් සිදුකරන මාතෘකා තෝරා ගෙන පර්යේෂණ සිදුකිරීම හා එමඟින් අනාවරණය වන කරුණු ඔස්සේ වගකිවයුතු පාර්ශවයන් වෙත උපදෙස් ලබාදෙමින් ජනමාධ්‍ය විෂයයේ අභිවෘද්ධිය

වෙනුවෙන් කටයුතු කිරීම මෙහි අරමුණ වන අතර මේ වන විට එවැනි පර්යේෂණ ගණනාවක් සිදු කර ඇති අතර "තුලනාත්මක අධ්‍යයනය" මැයෙන් තවත් පර්යේෂණයක් ද සිදුවෙමින් පවතී.

**මණ්ඩලයේ ප්‍රකාශන**

මෙකී ප්‍රකාශන පුවත්පත් කලාව සහ පුවත්පත් කලාවේදීයා කේන්ද්‍රගත කරගෙන නිකුත් වුවද අද වන විට සෙසු මාධ්‍ය ද ආවරණය වන පරිදි ප්‍රකාශන බිහිකිරීමට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය තීරණය කර තිබේ. මේ අනුව මාධ්‍ය සමීක්ෂා III එළිදැක්විය.



මාධ්‍ය සමීක්ෂා III එළිදැක්වීම

**මාසික දේශන මාලාවන්**

"ජනමාධ්‍ය නිදහස හා වගකීම" මැයෙන් 2018-01-27 දින මාසික දේශනයක් නේපාල ජාතික ලක්ෂ්මන් ඩට් ෆාන්ට් මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

**සන්නිවේදන කථිකාවත වැඩසටහන**

කාලීන වශයෙන් කථිකාවතට ලක්වන වැදගත් ග්‍රන්ථ හා වෙනත් නිර්මාණ ඇසුරින් කුඩා කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම මෙම වැඩසටහන මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහනේ 2018 වර්ෂයේ කථිකාවත් 28 ක් පවත්වා ඇත. මෙමඟින් අපේක්ෂා කරනුයේ ප්‍රවීණ නිර්මාණකරුවන් හා ජ්‍යෙෂ්ඨ නිර්මාණකරුවන්ගේ නිර්මාණ විමර්ශනශීලීව අධ්‍යයනය කරමින් එම නිර්මාණකරුවන්ට පහසුකම් සැපයීමයි.

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ඉගැන්වීමේ නියැලෙන ගුරුවරුන් සඳහා වන වැඩමුළු**

විශේෂයෙන්ම අගනුවරින් බැහැර ප්‍රදේශවල සන්නිවේදන විෂය ඉගැන්වීම් කටයුතුවල නියැලෙන ගුරුවරුන්ට ඔවුන්ගේ ඉගැන්වීම් කටයුතු පහසු කිරීමේ අරමුණින් න්‍යායික, ප්‍රායෝගික හා විෂයට අදාළ නව ප්‍රවණතා පිළිබඳ දැනුම ලබාදීම මෙම වැඩසටහනේ අරමුණයි. 2018-01-19 දින දකුණු පළාත ආවරණය වන පරිදි මාතරදීද, වයඹ පළාත ආවරණය වන පරිදී 2018-10-18 දින කුරුණෑගලදීද, සම්මන්ත්‍රණ පවත්වන ලදී.








ගුරුවරුන් සඳහා වූ වැඩමුළුව - කුරුණෑගල

**විදේශ සංචාර**

නේපාල පුවත්පත් මණ්ඩල සංචාරය සඳහා විශ්ව විද්‍යාල ආචාර්‍යවරුන් සඳහා අවස්ථාව ලබාදෙන ලදී.

**ආසියානු පුවත්පත් මණ්ඩල සහයෝගීතා සම්මන්ත්‍රණය (Co-operative Conference on Asia Press Councils)**

දකුණු ආසියානු රටවල පුවත්පත් මණ්ඩල හා ජනමාධ්‍ය මණ්ඩල අතර සහයෝගීතාවය වර්ධනය කිරීම, ගෝලීය ප්‍රවණතා කෙරෙහි අවබෝධය ඇතිකර ගැනීම හා එහි ප්‍රතිඵල මෙරට පුවත්පත් කලා වෘත්තිය වෙනුවෙන් දායක කර ගැනීම, හා ජනමාධ්‍ය විෂයෙහි ලා ජාත්‍යන්තර වශයෙන් වැදගත් විෂයානුබද්ධ මාතෘකා සාකච්ඡා කිරීම අරමුණු කරගෙන 2008 ඔක්තෝබර් මස 29-31 දිනයන්හි මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී. ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, මාලදිවයින යන රටවල පුවත්පත් මණ්ඩල සභාපතිවරුන් හා නියෝජිතයන් මේ සඳහා සහභාගී විය. (වියදම රු.මි. 2.9)

**ජනමාධ්‍යවේදීන් සඳහා සිංහල ඉංග්‍රීසි ශබ්ද කෝෂය**

ජනමාධ්‍යවේදීන් සඳහා සිංහල, ඉංග්‍රීසි ශබ්ද කෝෂයක් සකසා අවසන් වේ.

**2018 වර්ෂයේ මූල්‍ය විග්‍රහය**

2018 ජාතික අයවැය මඟින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු. මි. 29.09 ක් ද ප්‍රාග්ධන වියදම් ලෙස රු. මි. 4 ක් ද වෙන් කරන ලදී.

| අයිතමය | (රු.මි.) |
|---|---|
| උපයාගත් ආදායම | 3.21 |
| පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන | 29.09 |
| **මුළු** ආදායම | 32.30 |
| වියදම | 31.56 |
| බදු පසු ලාභය | 0.74 |

**2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්**

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම.
- අපක්ෂපාතීව හා යුක්තිසහගතව පුවත්පත් පැමිණිලි විභාග කිරීමේ කාර්යය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාම.
- නව මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම පිළිබඳව සාක් රටවල පුවත්පත් මණ්ඩල හා අදාල ආයතන සමඟ ඇතිකර ගැනීමට යෝජිත එකඟතා ගිවිසුම.
- මාධ්‍යවේදීන්ගේ සුභසාධනය හා විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම අරමුණු කර පැවැත්වීමට යෝජිත දැනුවත් කිරීමේ වැඩසටහන්.
- පාසැල්, විශ්ව විද්‍යාල සිසුන් හා අදාළ අංශ දැනුවත් කිරීම අරමුණු කර පවත්වන වැඩසටහන්.
- පාසැල් ළමුන්ගේ මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම අරමුණු කර පාසැල් මාධ්‍ය ඒකක සමඟ පවත්වන වැඩසටහන්.
- මාධ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් අනුපමේය සේවයක් ඉටුකළ මේ වන විට නොයෙක් ප්‍රායෝගික අපහසුතාවයන් මධ්‍යයේ සිටින ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තිමයභාවය ඉහල නැංවීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතිකපත් පාඨමාලා පැවැත්වීම.
- ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් දීපව්‍යාප්ත පර්යේෂණ සිදුකිරීම.

# සැලසිනේ රූපවාහිනී ආයතනය

**හැඳින්වීම**

රූපවාහිනී මාධ්‍ය ශ්‍රී ලංකාවේ ආරම්භ වීමත් සමඟ රජයේ ප්‍රචාරණ කටයුතු සිදු කර ගැනීම අරමුණු කර ගනිමින් රූපවාහිනී මාධ්‍ය සඳහා අවශ්‍ය ප්‍රවෘත්ති නිෂ්පාදනය කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ සැලසිනේ රූපවාහිනී ආයතනය 1982 පෙබරවාරි 02 වන දින ආරම්භ කරන ලදී.
මාධ්‍ය මෙහෙවර පුළුල් වීමත් සමග සැලසිනේ රූපවාහිනී ආයතනය ප්‍රවෘත්ති නිෂ්පාදනයෙන් ඔබ්බට ගොස් රූප මාධ්‍යකරණයේ නව මංපෙත් කරා යොමු විය.

ශ්‍රී ලංකා රාජ්‍ය යාන්ත්‍රණයෙහි සංවර්ධන වැඩසටහන් හා මෙහෙයුම්වල වර්ධනීය තත්වයන් නිර්මාණාත්මක භාවිතයන් තුළින් පොදු ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම මූලික ඉලක්කය කොට කටයුතු කරමින් පවතී.
ඒ අනුව සන්නිවේදනයේ හා අලෙවිකරණයේ නව සහශ්‍රකය තුළ රාජ්‍ය වැඩසටහන්වල ශක්තිමත්, පුළුල් ප්‍රචාරණයන් පොදු ජනතාව වෙත නව මුහුණුවරක් ලබා දෙමින්, ඉසව් කළමනාකරණය, වෙළඳ ප්‍රචාරණය, අලෙවිකරණයේ හැකියාවෙන් සපිරි නවීන තාක්ෂණික උපකරණවලින් සමන්විත සන්නිවේදන ආයතනය බවට මේ වන විට පත්ව ඇත.

**දැක්ම**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ප්‍රචාරක ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සභාය භාවිතා කරමින් උපක්‍රමශීලිත්වය මෙන්ම උසස් තලයේ තාක්‍ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රියව දායකවීම.

**අරමුණු**

- වෙළඳපල පුළුල් කර ගැනීම.
- වියදම් අවම කිරීම තුළින් ලාභය උපරිම කිරීම.
- සේවාලාභී සන්තෘප්තිය ඉහළ නැංවීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.
- මානව සම්පත් සංවර්ධනය.

**කාර්යභාරය**

- රජයේ ප්‍රචාරණ මාධ්‍ය ආයතනයක් ලෙස කටයුතු කිරීම තුළින් රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරණ කටයුතු
- විද්‍යුත් / මුද්‍රිත මාධ්‍ය දැන්වීම් නිර්මාණය, ඒ සඳහා මාධ්‍ය සැලසුම් ඉදිරිපත් කිරීම හා එම දැන්වීම් උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණ කටයුතු නිර්මාණය
- අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා සංකල්ප නිර්මාණය
- මාධ්‍ය පර්යේෂණ සිදු කිරීම.
- වෙබ් අඩවි නිර්මාණය
- අධිවේගී මුද්‍රණ කටයුතු සිදු කිරීම.

**2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

ආයතනයේ ප්‍රධානතම ආදායම් මූලාශ්‍රය උපලේඛණගත කිරීම වන අතර ඉසව් කළමනාකරණය සහ මුද්‍රණ කටයුතුවලින් ආදායම් උපයාගනී.

ආදායම් උත්පාදන සැලැස්ම අනුව උපයාගත් ආදායම පහත වගුවේ දක්වා ඇත.

| වැඩසටහන | භෞතික | | | මූල්‍ය (රු.මි.) | | | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | % | ආදායම් ඉලක්කය | ප්‍රගතිය | % | |
| **ආදායම් උත්පාදනය** | | | | | | | |
| උපලේඛණගත කිරීම (Scheduling) | 1125 | 784 | 70 | 425.00 | 433.98 | 102 | 368.85 |
| නිෂ්පාදන කටයුතු | 36 | 59 | 150 | 35.00 | 64.99 | 186 | 51.99 |
| ඉසව් කළමනාකරණය | 45 | 25 | 33 | 120.00 | 52.04 | 43 | 41.63 |
| ග්‍රැෆික් නිර්මාණ | 89 | 329 | 732 | 50.00 | 50.73 | 101 | 44.14 |
| වෙබ්අඩවි නිර්මාණය | | | | | 0.60 | | 0.51 |
| **එකතුව** | | | | **630.00** | **602.35** | **96%** | **507.15** |

**වෙළඳපල ප්‍රවර්ධනය**

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|
| සැලසිනේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය සඳහා වෙබ් අඩවිය හා ෆේස්බුක් පිටුව සකස් කිරීම | | | 100% |
| නව සේවාදායකයින් හඳුනා ගැනීම | | | |
| - රාජ්‍ය අංශය | 67 | 6 | 9% |
| - පෞද්ගලික අංශය | 53 | 12 | 23% |

**මානව සම්පත් කළමනාකරණය**

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|
| සේවක කාර්ය සාධනය ඇගයීමට ක්‍රමවේදයක් හඳුන්වා දීම | 70 | 70 | 100% |
| පුහුණු හා සංවර්ධනය | 05 | 15 | 300% |

**ඉටු කරන ලද ප්‍රධාන ඉසව් කළමනාකරණ වැඩසටහන්**

- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සංවිධානය කළ සංහිඳියාව පිළිබඳ වූ "අහන්න" ගමින් ගමට ප්‍රවර්ධන වැඩසටහන
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සංවිධානය කළ ගම්පෙරළිය වැඩසටහනෙහි පළාත් මට්ටමින් සිදුකළ ග්‍රාම සංවර්ධන වැඩසටහන්හි ඉසව් කළමණාකාරීත්වය
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සංවිධානය කළ "එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා" වැඩසටහනෙහි මොනරාගල ප්‍රදර්ශනය
- සංචාරක අමාත්‍යාංශය සංවිධානය කළ ත්‍රීරෝද රථ රියදුරන් සඳහා වූ Tuk Tuk ප්‍රවර්ධන වැඩසටහන

- විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සංවිධානය කළ ඉන්දීය ශ්‍රී ලංකා ද්වීපාර්ශවීය ගිවිසුම්ගත වීමේ උළෙල
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සංවිධානය කළ ජනමාධ්‍යවේදීන් සඳහා වූ බලශක්ති මාධ්‍ය සම්මාන උළෙලෙහි දැනුවත් කිරීමේ වැඩසටහන
- ලංකා විදුලිබල මණ්ඩලය සංවිධානය කළ ප්‍රදර්ශන කුටි

**2018 වර්ෂය තුළ ආයතනයේ ප්‍රගතිය උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ග**

- ආයතනයේ සේවකයන්ගේ වැටුප් විෂමතාවය නිරාකරණය සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 අනුව සිදු කිරීමට පියවර ගන්නා ලදී.
- ආයතනයේ සේවකයන් සඳහා රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබූ රු.මි. 18.3 ක මුදලින් රු.මි. 15.0 ක් ගෙවා අවසන් කිරීම. වැට් බදු හිඟ මුදල් ලෙස එකඟ වූ මුදලින් වර්ෂයට අදාළව රු.මි. 10.0 ක් ගෙවීම.
- ආයතනයේ සේවකයන්ගේ හැකියාවල පවතින අඩුපාඩු හඳුනා ගැනීම, දක්ෂතා/ සේවක අතිරික්ත/ ඌනතා පෙරදැරි කරගෙන වැඩ අධ්‍යයනයක් (Work Study) කිරීම.
- ගිණුම් කටයුතු, තොරතුරු වාර්තා කිරීම කාර්යක්ෂම කිරීමට සියලු අංශ සඳහා ගැළපෙන Job Manager මෘදුකාංගය හඳුන්වා දීම.
- කාර්යයක් නොමැතිව සිටි සේවකයන් කාර්යයන්හි පිහිටුවීම, අනිසි ලෙස දීමනා ලබාගත් සේවකයන්ගේ දීමනා අත්හිටුවීම හා සේවකයන් කම්කරු උසාවියේ ගොනු කර තිබූ නඩු සමථයකට පත්කිරීම.
- ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ගැනීම සඳහා අවශ්‍ය වාර්තා අමාත්‍යාංශයට යොමු කිරීම.

**2019 වසර සඳහා සැලසුම්**

- පසුගිය වසර 35 ක කාලයක් තුළ සැලසිනේ ආයතනය ප්‍රචාරක ආයතනයක් ලෙස නිසියාකාරව ලියාපදිංචිව නොමැති හෙයින් ඒ සඳහා අවශ්‍ය නිතීමය කටයුතු සම්පාදනය කර ලියාපදිංචි ආයතනයක් බවට පත්කිරීම.
- 2019 වර්ෂයේ පිරිවැටුම 10% කින් ඉහළ නැංවීම.
- රාජ්‍ය ආයතන සඳහා පමණක් සැපයූ සේවාව පෞද්ගලික අංශයටද ව්‍යාප්ත කිරීම.
- වර්තමානයේ රාජ්‍ය අංශයේ ප්‍රචාරක ක්‍රමවේදයන් ලෙස යොදා නොගන්නා සමාජ ජාල මාධ්‍ය ප්‍රචාරණය (Intranet Based Advertising) වෙත රාජ්‍ය අංශය යොමු කිරීම තුළින් අවම පිරිවැයක් කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය අංශය වෙත සැපයිම.
- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය උපලේඛනගත කිරීම සඳහා ශ්‍රේණිගත කිරීම (Rating), පර්යේෂණ දත්ත (Research Data) සහ ආයෝජන මත ලැබීම් (R.O.I) ගණනය කිරීම් යොදා ගනිමින් රාජ්‍ය අංශයේ ප්‍රචාරණ වැඩසටහන් වඩාත් ප්‍රතිඵලදායී ලෙස ඉටුකර දීම හෝ උපදේශන සේවා සැපයීම.

- කාලීනව රට තුළ සිදුවන ජනතාව දැනුවත් කළ යුතු අවශ්‍යතා හඳුනාගෙන එකී කටයුතු සඳහා ප්‍රචාරාත්මක අවශ්‍යතා ඇති ආයතනවලට ප්‍රචාරාත්මක වැඩසටහන් හඳුන්වාදීම හා අලෙවි කිරීම.

- සියලු පළාත් සභාවලට අදාළ විෂය පථයන්වල අදාළ ක්ෂේත්‍රයන් සඳහා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය කරදීම තුළින් ව්‍යාපාරික අවස්ථා පළාත් සභා දක්වා පුළුල් කිරීම.

- මුල් වර්ෂයේ පසුගාමී අංශ හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම. (ආයතනය සතු භෞතික හා මානව සම්පත්වල ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක බව ඒ සඳහා හේතුවී නම් බාහිර හෝ වෙනත් ක්‍රමවේද මගින් මානව හා භෞතික සම්පත් සපයා ගැනීම.)

- ඉලක්කගත සේවා ප්‍රවර්ධනට අවශ්‍ය ආයතනික ව්‍යුහය අවශ්‍ය පරිදි ප්‍රතිසංවර්ධනය, කාර්ය මණ්ඩල පුහුණුව හා කාර්යක්ෂමතාවය වර්ධනයට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ආයතනයේ භෞතික හා මානව සම්පත් අංශවල යම් පසුබෑමක් තිබේනම් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගවලට එළඹීම.

# Contact Details of Officials of the Ministry of Mass Media

'Asidisi Medura', No 163, Kirulapona Mawatha, Polhengoda, Colombo 05

| Name & Designation | Tel No | Mobile | Fax No | Email |
|---|---|---|---|---|
| **Mr. Sunil Samaraweera**<br>Secretary | 0112484510 | 0773447077 | 0112513458 | ssamaraweera60@yahoo.com |
| **Mrs. Ramani Gunawardhana**<br>Additional Secretary (Administration) | 0112513398 | 0777259711 | 0112512346 | rpwgunawardhana@gmail.com |
| **Mrs. U.P.L.D. Pathirana**<br>Additional Secretary (Development & Planning) | 0112513943 | 0714425435 | 0112512343 | inforplanning@gmail.com |
| **Mrs. Wasanthika Dias**<br>Senior Assistant Secretary | 0112514631 | 0714264076 | 0112513462 | wasanthikadias@yahoo.com |
| **Mr. J.W. Kithsiri**<br>Director (Development) | 0112513644 | 0718025551 | 0112512343 | dskithsiri@gmail.com |
| **Ms. W.A.P. Wellappuli**<br>Director (Planning) | 0112513470 | 0714076273 | 0112514351 | inforplanning@gmail.com |
| **Mr. K.P. Jayantha**<br>Director (Media) | 0112513469 | 0773996320 | 0112513469 | jayantha512@yahoo.com |
| **Mrs. M.C.S. Devasurendra**<br>Assistant Director | 0112513446 | 0773510168 | 0112513466 | inforplanning@gmail.com |
| **Mr. M.P. Bandara**<br>Assistant Secretary | 0112512524 | 0718663924 | 0112515701 | krama037@gmail.com |
| **Ms. B.R. Ranasinghe**<br>Accountant | 0112513442 | 0716462371 | 0112513442 | ranasinghebr@gmail.com |
| **Mrs. D.P.U. Welarathna**<br>Legal Officer | 0112513468 | 0773301917 | 0112513468 | uwelarathna@gmail.com |

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministry of Mass Media

අංක.163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05.
163, எசிதிசி மெதுர, கிருளபன மாவத்தை, பொல்ஹேன்கொட, கொழும்பு 05.
163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05.

**www.media.gov.lk**